2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report



ජනමාධ්‍ය අමාත්‍යාංශය

வெகுசன ஊடக அமைச்சு

Ministry of Mass Media

වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2021

ජනමාධ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 105

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව
මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

			පිටුව
පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 18
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19 - 38
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	39 - 49
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක	51 - 53
පරිච්ඡේදය 05	-	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	55 - 59
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	61 - 65
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	67 - 76

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඈ) ව්‍යාපෘති කාල සීමාව

1.0 ජනමාධ්‍ය අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

යහපත් සමාජයීය ඉදිරි ගමනකදී මානව සබඳතා, චර්යාත්මක එළඹුම්, ආකල්ප සහ ජනමත ස්ථාපනය කෙරෙහි වඩාත් බලපෑමකාරී සාධකය වන්නේ ජනමාධ්‍යයි. දියුණු තාක්ෂණයට පිවිසීම තුල වගකීම් සහගතභාවය සහ ගුණාත්මකභාවය හරහා යහපත් මාධ්‍ය භාවිතාවක් පවත්වාගෙන යාම අනිවාර්ය කරුණක් වනු ඇත.

මෙම අමාත්‍යාංශය ජනමාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ජාතික අවශ්‍යතාවය හඳුනාගනිමින් ඊට නිසි ජවය හා උත්තේජනය සපයමින් “සෞභාග්‍යයේ දැක්ම” සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මාර්ගයේ ගමන් කරමින් පවතී.

විසි එක්වැනි සියවසට ගැලපෙන සමාජයක් නිර්මාණය කරනු පිණිස භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස රැකගැනීම පිණිස ජනමාධ්‍ය ආයතන හා සේවයේ නියුතු වෘත්තියවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් සහ නිරවුල් පරිසරය නිර්මාණය කිරීම රජයේ වගකීමයි.

යහපත් මාධ්‍ය සංස්කෘතියක් ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රය තුල ගොඩනැගීම සඳහා ඉහළ වෘත්තීය නිපුණත්වයෙන් යුත් ජනමාධ්‍යවේදීන් බිහිකරලීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. නවීන තාක්ෂණයත් සමග ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සිදුවන තාක්ෂණික භාවිතයට අනුගතවීමටද ගෝලීය වර්ධනය සමග ජාතික සහ ජාත්‍යන්තර සබඳතා විෂයය සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමට හා අන්තර්ජාතික ප්‍රමිතිකරණයට සරිලන ලෙස ජනසන්නිවේදන විෂය ධාරාව ප්‍රතිසංවිධානය කිරීමද කළ යුතුව ඇත.

මෙය යථාර්තයක් බවට පත් කරනු වස් ඉහළ වෘත්තීය නිපුනතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කළ යුතු බවට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇත. ඒ අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිතව "ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය" (Chartered Institute of Journalists – Sri Lanka) යන නමින් ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනය පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එසේම වර්තමාන සන්දර්භය තුල සදාචාරාත්මක ස්වයං පාලනයක් සහිත මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීමට අවශ්‍ය මාධ්‍යවේදීන් මෙම යෝජිත උසස් අධ්‍යාපන ආයතනය තුලින් බිහිකරලීම ප්‍රධාන අරමුණ වේ.

ජනමාධ්‍යවේදීන් සඳහාම හඳුන්වා දී ඇති “ඇසිදිසි” ශිෂ්‍යත්ව වැඩසටහන මගින් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මූල්‍යාධාර සැපයීමද අඛණ්ඩව ක්‍රියාත්මක වේ. ජනතාව දැනුම්වත් කිරීමේ ජාතික වගකීමට උරදී සිටින රට පුරා ව්‍යාප්ත සියලු මාධ්‍යවේදීන්ට තම මාධ්‍යකරණ කාර්යය මනාව ඉටු කිරීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික හා රාජකාරීමය දිවියේ සුරක්ෂිතභාවයක් හා විශ්වසනීයභාවයක්

පැවතිය යුතුය. මාධ්‍යවේදීන් විසින් සිදුකරනු ලබන භාරදූර කාර්යභාරය අවබෝධ කරගෙන ඇති මෙම අමාත්‍යාංශය ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් "ඇසිදිසි" රක්ෂණාවරණය හඳුන්වා දෙන ලදී.

රූපවාහිනී ඩිජිටල්කරණ ව්‍යාපෘතිය මීට දශකයකට පමණ පෙර ආරම්භ වුවද තාක්ෂණික ශක්‍යතාවය පිළිබඳ සංවාදය හේතුවෙන් එය අක්‍රියව පැවැතිණි. වසර 40 ක රූපවාහිනී ගමන් මගේ අන්තර්ජාතික හැරවුම් ප්‍රවේශයක් ලෙස මෙරට ඇනලොග් රූපවාහිනී විකාශන පද්ධතිය පූර්ණ ඩිජිටල්කරණයට ලක් කිරීමේ වැඩසටහන (Digital Terrestrial Television Broadcasting - DTTB Project) 2021 දෙසැම්බර් මස 28 දින ආරම්භ කිරීමට හැකි වීම විශේෂ ජයග්‍රහණයකි. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලාංකේය රූපවාහිනී නැරඹීමේ කලාව විශාල පරිවර්තනයකට ලක් වනු ඇත.

පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවතිය යුතුය. ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ගෝලීය වර්ධනය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රමිතිකරණය සඳහා පවතින අණපනත්, අන්තර්ජාතික මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය සහ සමාජ සංස්කෘතික අනන්‍යතා ක්ෂේත්‍රයන්ට විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලාංකික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය මෙන්ම ප්‍රතිපත්ති හා අචාරධර්ම සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

මාධ්‍යවේදීන්ට හා ජනමාධ්‍ය ආයතනවලට අදාලව පවතින නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම තුලින් එම ආයතන ශක්තිමත් කිරීම මෙන්ම එම ආයතන මූල්‍යමය වශයෙන් ස්ථායී ආයතන බවට පත් කිරීමටත් හැකි වනු ඇත.

මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය රැඳී ඇත්තේ සාම්ප්‍රදායික මාධ්‍ය කලාවෙන් ඔබ්බට විහිදුනු තොරතුරු මත පදනම් වූ නව මාධ්‍ය ගමනකිනි. සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුම, අවබෝධය සහ සන්නිවේදන උපක්‍රම සමාජගත කිරීම සහ ඩිජිටල් තාක්ෂණයට අනුගතවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම කෙරෙහි මේ වන විට අවධානය යොමු වී තිබේ. මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීම සඳහා අමාත්‍යාංශයේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය තම සහයෝගය අඛණ්ඩව ලබා දේ.

පුරවැසියාට තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුල ක්‍රියාත්මකවන සෑම රටකටම ඇති ප්‍රධානතම වගකීමකි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවද තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිදහස් හා වගකීමෙන් යුතු ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායකවේ. ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලී පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නහා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම් සිදු කරමින් මහජනතාවට නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැනගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් සිය දායකත්වය ලබා දී ඇත.

රජයේ මුද්‍රණාලය සීඝ්‍රයෙන් වෙනස්වන තාක්ෂණික පරිසරයට සමගාමීව තම තාක්ෂණික ධාරිතාවය ඉහළ නැංවීමට පියවර ගනිමින් සිටී. ගෝලීය මුද්‍රණ ක්ෂේත්‍රයේ ඩිජිටල් තාක්ෂණය හා අනුගත වෙමින්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ද එම අභියෝග ජය ගැනීමට ආර්ථික, සමාජීය හා

තාක්ෂණික පරිසර සාධක පිලිබඳව මනා අවබෝධයකින් කටයුතු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. ආරක්ෂිත මුද්‍රණ විෂයෙහි තාක්ෂණික ධාරිතාවයෙන් සන්නද්ධ කිරීම සඳහා සහ අධි තාක්ෂණික ආරක්ෂිත මුද්‍රණයන්ට පිවිසීම මගින් දෙපාර්තමේන්තු කාර්යභාරය පුළුල් කිරීම සඳහා අවශ්‍ය පරිසරය ගොඩනැගෙමින් පවතී.

අතිවිශාල තැපැල් කාර්යාල ජාලයකින් සමන්විත තැපැල් දෙපාර්තමේන්තුව තම ආදායම් වියදම් පරතරය අවම කර ගැනීම සඳහා අවධානය යොමු කර ඇත. ඒ යටතේ නව ආදායම් උත්පාදන මාර්ග හඳුනාගැනීමේ අවශ්‍යතාවය අවබෝධ කරගෙන ඇත. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ බහුකාර්ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රවේශ වී ඇත. ශ්‍රී ලංකා තැපැල් සේවාව වර්තමාන තරඟකාරී වෙළඳපොළට මෙන්ම කාර්යබහුල පාරිභෝගික ජීවන රටාවට ගැලපෙන පරිදි නවීකරණයට සහ නවෝත්පාදනයට ලක්විය යුතු බැවින් එයට අනුගතවීම සඳහා තැපැල් කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණයට ලක්කිරීම සඳහා ද සැලසුම් සකසමින් පවතී.

මෙරට ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුල මාධ්‍ය හැසිරවීමේදී රාජ්‍ය මාධ්‍යයන්ට ඍජු වගකීමක් පැවරී ඇත. මාධ්‍ය සම්ප්‍රදායන් ආරක්ෂා කර ගනිමින් ජනමාධ්‍ය මෙරට ප්‍රගමනය උදෙසා භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව රාජ්‍ය මාධ්‍යයන්ට තිබෙනුයේ අත්හල නොහැකි වගකීමකි.

රජයේ මාධ්‍ය ආයතන වාණිජ වශයෙන් සාර්ථක විය යුතුය. රාජ්‍ය මාධ්‍ය තුල නිර්මාණශීලිත්වයේ හා තරඟකාරීත්වයේ පසුබෑමක් පවතින බව හඳුනාගෙන ඇති බැවින් දැනට පාඩු ලබමින් පවතින රාජ්‍ය මාධ්‍ය ආයතන ලාභ ලැබීමේ තත්ත්වයට පත් කර ගැනීමට නම්, වඩාත් නිර්මාණශීලී හා තරඟකාරී වැඩසටහන් ඉදිරිපත් කළ යුතු වේ.

මෙම අමාත්‍යාංශය යටතේ ඇති මුද්‍රිත මාධ්‍ය ආයතනය වන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) 2021 වසරේ මුහුණපාන ලද ආර්ථික අර්බුදය හමුවේ එහි පුනරාවර්තන වියදම් පියවාගැනීම සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපීමට සිදු විය. නමුත් ආයතනයේ උපාය මාර්ගික සැලැස්ම 2021-2024 දැනට සාර්ථකව ක්‍රියාත්මක වන අතර 2022 වසරේදී සැලකිය යුතු ආදායමක් උත්පාදනය කිරීමට අපේක්ෂිතය. තවද ආයතනයේ සේවක වැටුප් සහ දීමනා සඳහා ආදායමෙන් 65% ක් පමණ වැයවන බැවින් පිරිවැය අවම කර ගැනීම සඳහා මෙම වසරේ ස්වෙච්ඡා සේවක විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවටද 2021 වසරේ රටේ පැවති ආර්ථික දුෂ්කරතා හමුවේ ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් වෙනුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපීමට සිදු විය. මෙම වසරේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පුනරාවර්තන වියදම් සඳහා පමණක් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දෙන ලදී. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තම පුනරාවර්තන අවශ්‍යතා ආයතනය විසින්ම සපුරා ගන්නා ලද අතර 2018 වර්ෂයේ අනුමත වූ වසන්තම් රූපවාහිනියේ (VTV) විකාශන කටයුතු පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දෙන ලදී. කෙසේ වුවද මෙම විද්‍යුත් මාධ්‍ය ආයතන තුනෙහිම තාක්ෂණික වැඩිදියුණු කිරීම් කළ යුතු බව හඳුනාගෙන ඇත.

2022 වසරේදී සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ස්වයං උත්පාදිත ආයතන ලෙස කටයුතු කිරීම සඳහා තම උපායමාර්ගික සැලසුම්වලට අනුගතව කටයුතු කර ලාභ උපයන ආයතන බවට පත් කිරීමද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමායන ලක්ෂ්‍යය කරා ළඟාකරවීම ද මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්වයං උත්පාදිත ආයතනයක් වන අතර 2021.11.17 දින අංක 2254/30 අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂය පථය යටතට පත් කරන ලදී. මුද්‍රණ ක්ෂේත්‍රය සඳහා නිපුණත්වයෙන් හෙබි පිරිසක් රටට බිහිකිරීමේ මහඟු කාර්යය මෙම ආයතනය මගින් ඉටු කරනු ලැබේ.

ස්වයං උත්පාදිත ආයතනයක් වන සැලසිනේ රූපවාහිනී ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශයෙන් සිදු කළ යුතු කාර්යයක් බැවින් නිපුනතාවයෙන් අනූන සේවකයන් මෙම ආයතනයට ආකර්ෂණය කරගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු වී ඇත. සැලසිනේ ආයතනය නීතිගත කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

ශ්‍රී ලංකා පදනම් ආයතනය වෙළඳපොල ඉල්ලුමට අනුව පාඨමාලා හඳුන්වාදීමට කටයුතු කරමින් පවතී. ශ්‍රී ලංකා පදනම පනත ද ඉදිරි අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ව්‍යුහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත හා නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙසද මාධ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානයක් ලෙසද ප්‍රතිසංවිධානය කෙරෙන බව ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වේ. ඊට අනුගත වෙමින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් පත්‍රකලාවේදීන් සඳහා හඳුන්වා දී ඇති ආචාරධර්ම සංග්‍රහය මෙම වසරේදී වසර 40 ක් සපුරන ලදී.

ලංකාපුවත් ආයතනය රජයේ ක්‍රියාදාමයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සිය වෙබ් අඩවිය හා දුරකතන කෙටි පණිවුඩ සේවාව පවත්වාගෙන යයි. මෙම ආයතනය රටේ සංවර්ධන ක්‍රියාදාමය සඳහා සක්‍රියව සම්බන්ධ කරගැනීමට යෝජිතය.

ඕනෑම සමාජයක් නිසි පරිදි ක්‍රියාත්මක වීමටත්, එහි ප්‍රතිසංස්කරණයන් හා නවීකරණයන් ප්‍රශස්ත මට්ටමකින් සිදු වීමටත්, ජනමාධ්‍ය, සිය මූලික කාර්ය භාරය වන ජනමතය නිසි ලෙස හැඩගැස්වීම කළ යුතුය. ආර්ථික වශයෙන් රටක් ගොඩනැගීමෙහිලා ක්‍රියාත්මක සංවර්ධන වැඩපිළිවෙළ සුබදායී දිශානතියකට යොමු කිරීමට ජනමාධ්‍ය සතු ප්‍රබල ශක්‍යතාවයන් නිසි පරිදි යොදා ගැනීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

1.2 ආයතනික දැක්ම, මෙහෙවර, පරමාර්ථ

දැක්ම

''මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්''

මෙහෙවර

''ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම**''**

පරමාර්ථ

1. වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
2. මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
3. නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
4. මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම උදෙසා දිරිගැන්වීම.
5. ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගීත්වය ඉහළ නැංවීම.
6. ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
7. අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
8. අමාත්‍යාංශය වෙත අනුබද්ධිත වූ ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
9. අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුලින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

2020.10.06 දිනැති අංක 2196/27 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව විෂයපථය, කාර්යයන් හා කර්තව්‍යයන් හා අමාත්‍යාංශයේ සුවිශේෂී ප්‍රමුඛතා

1.3.1 විෂයපථය

භාෂාවේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීමය කුසලතා සංවර්ධනයට කටයුතු කිරීම.

1.3.2 කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක්" හඳුන්වාදීම සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කිරීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

1.3.3 සුවිශේෂී ප්‍රමුඛතා

- විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමෙන් කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුලු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තිමය දැනුම සහ අවබෝධය ලබාදීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් හඳුන්වාදීම.
- නව තාක්ෂණය පදනම්ව කාර්යක්ෂම හා නව අවස්ථාවන්ට ඉලක්කගතවූ ජනතා කේන්ද්‍රීය ඩිජිටල් තැපැල් හා ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම.

1.4 සංවිධාන සටහන - 2021

ජනමාධ්‍ය අමාත්‍යාංශය



අනෙකුත් තනතුරු :	අනුමත		අනුමත
ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර, සංවර්ධන නිලධාරී	44	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) නිලධාරී	01
විමර්ශන නිලධාරී (ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය)	11	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) සහකාර	05
රාජ්‍ය කලමනාකරණ සහකාර	27	සහකාර තාක්ෂණික නිලධාරී	01
පිළිගැනීමේ නිලධාරී	01	රියදුරු	18
		කාර්යාල සහායක	20

අනුමත සේවක සංඛ්‍යාව - 158

තත්‍ය සේවක සංඛ්‍යාව - 98

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව – 2020.09.04, 2020.09.18 සහ 2020.11.27 දිනැති ලිපි ප්‍රකාරව

1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ඇති දෙපාර්තමේන්තු සංඛ්‍යාව 03 කි.

1.5.1 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 1948 ජූනි මස 30 දින ආරම්භ කරන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මගින් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිවයුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීමද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

1.5.2 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වර්ෂ 1802 දී "ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය" ලෙසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ රජයේ මුද්‍රණාලය ලෙස මෙම දෙපාර්තමේන්තුවේ ලිඛිත ආරම්භය සනිටුහන් වේ. පසුකාලීනව රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස විකාශය වූ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මේ වන විට "රජයේ නිල මුද්‍රණකරුවා" ලෙස පුරෝගාමී මෙහෙවරක යෙදී සිටී. විශේෂයෙන්ම අවම සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් ආරම්භ වූ මෙම දෙපාර්තමේන්තුව මේ වන විට නූතන අධිතාක්ෂණික ක්‍රමවේද සමඟ අනුගත වෙමින් ඉතා විශිෂ්ඨ සේවාවක් රජය වෙනුවෙන් සපයනු ලබන බව ඉතා පැහැදිළි කරුණකි. කර්මාන්තශාලාමය ස්වභාවයක් ගත් නිෂ්පාදන ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුව මගින් සියලුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල හදිසි, වැදගත් මෙන්ම රහස්‍ය මුද්‍රණ කටයුතු ඉතා උසස් නිමාවකින් යුක්තව කලට වේලාවට ඉටු කර දීම තුළින් අදාළ ආයතනයන්හි විශ්වාසය තහවුරු කර ඇත.

නවීන මුද්‍රණ ක්‍රමවේද උපයෝගී කර ගනිමින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතු මුද්‍රණ නිමැවුම් ඉදිරිපත් කරමින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව නොනිමි මෙහෙවරක් ඉටු කරනු ලබයි. එමෙන්ම, ආරක්ෂිත මුද්‍රණ ක්‍රමවේදයන් වැඩිදියුණු කර ශ්‍රී ලංකා රජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

1.5.3 ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සන්නිවේදන සේවා සැපයීමේ ප්‍රමුඛතමයා වශයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අත්‍යවශ්‍ය සේවා සපයන රාජ්‍ය ආයතනයකි. ස්වෛරීභාවයේ සිට පෞද්ගලීකරණය සහ තරඟකාරීත්වය ඇතිවීම දක්වා තැපැල් දෙපාර්තමේන්තුවට තම උන්නතිය උදෙසා බොහෝ අභියෝගයන්ට, ප්‍රධාන වශයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවට මුහුණදීමට සිදුවී ඇත. නමුත් අන්තර්ජාල ව්‍යාපාරික කටයුතු හා බද්ධ වී සේවා සැපයීම (E-

Commerce), මූල්‍ය සේවා (Financial Inclusion) හා සැපයුම් සේවා (Logistics Services) අංශයන් කෙරෙහි ඇති ව්‍යාපාරික නැමියාවේ කැපීපෙනෙන වර්ධනය හමුවේ දෙපාර්තමේන්තුවට ලැබී ඇති අවස්ථාවන් අතිමහත් වේ.

ඒ අනුව ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර හා දේශීය තැපෑල සම්බන්ධයෙන් වන නව ප්‍රවණතාවයන්ට අනුගතව, නවීන තාක්ෂණය හා අලෙවිකරණ සංකල්ප යොදාගනිමින් වෙනස් වන පාරිභෝගික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාර්යක්ෂම හා ගුණාත්මක සේවා ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

තැපැල් දෙපාර්තමේන්තුව යනු හුදෙක් ලාභ ලැබීමේ අරමුණින් පමණක් පවත්වාගෙන යනු ලබන ආයතනයක් නොව සමාජ සේවා ක්‍රියාත්මක කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ඉතා වැදගත් කාර්යභාරයක් සමාජය උදෙසා ඉටුකරනු ලබන රාජ්‍ය ආයතනයක් බව මනාව තහවුරු වේ.

1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

iii) සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

iv) සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

v) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

vi) සැලසිනෙ රූපවාහිනී ආයතනය

vii) සී/ස ලංකා පුවත් සමාගම

viii) ශ්‍රී ලංකා පදනම් ආයතනය

ix) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

x) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

1.6.1 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

1949 ඔක්තෝබර් 01 වැනි දින ගුවන් විදුලි දෙපාර්තමේන්තුව නැමැති ස්වාධීන ආයතනයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලද මෙම ආයතනය 1972 මැයි 22 ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස නාමය වෙනස් කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ගුවන් විදුලි සන්නිවේදනයේ ප්‍රමුඛතම පුරෝගාමී මාධ්‍ය ජාලය ලෙස ශ්‍රාවකයන් කේන්ද්‍රගත කරමින් ඒ ඒ සමාජ අවශ්‍යතා හඳුනාගනිමින් ‘‘පහසුකම් සපයන්නෙකු’’ ලෙස ජනතාවගේ විවිධ අවශ්‍යතා ඉටුකරන විද්‍යුත් මාධ්‍ය ජාලය බවට පත්ව ඇත. FM තරංග මාලා ඔස්සේ දේශීය විකාශන ජාලය තුළ ජාතික නාලිකා 06 කින්, ප්‍රාදේශීය සේවා 07 කින් සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවකින් සමන්විතව විකාශන කටයුතු සිදුකරනු ලබන අතර ගුවන් විදුලි සංස්ථාව ප්‍රධාන FM විකාශන මධ්‍යස්ථාන 09 ක් මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි විකාශන කටයුතු සිදුවේ. මීට අමතරව මධ්‍යම තරංග මාලා ඔස්සේ පුත්තලම හා මධ්‍යම හා කෙටි තරංග මාලා ඔස්සේ ත්‍රිකුණාමලය යන ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන මඟින් විදේශීය විකාශන කටයුතු සිදුකරනු ලබයි. විශ්වාසනීය හා අවංක මාධ්‍ය මෙහෙවරකින් යුතු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ශ්‍රාවකයාට වඩාත් සමීපවීම පිණිස තම වෙබ් අඩවිය ඔස්සේ ජාත්‍යන්තරය යාකිරීමේ මාර්ගයට ද ප්‍රවේශ වී ඇත. 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ සංස්ථාවේ කාර්යභාරය ලැයිස්තුගත කොට තිබේ.

1.6.2 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මඟින් ස්ථාපිත කරනු ලැබීය. මෙරට රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වාගෙන යාමේ කාර්යය සහ එම සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණුකිරීම ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා ද අදාළ පනතෙන් විධිවිධාන සලසා ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම සිදුවේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ‘‘රූපවාහිනී’’, ‘‘අයි’’ සහ ‘‘නේත්‍රා’’ වශයෙන් නාලිකා තුනක් ඔස්සේ රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කරයි. සිඟුයෙන් වෙනස් වෙමින් පවතින රූපවාහිනී තාක්ෂණයට අනුගත වෙමින් ප්‍රේක්ෂකයින් වෙත උසස් තත්ත්වයේ නිර්මාණයන් ළඟා කර දීම සඳහා ජාතික නාලිකාව වශයෙන් ජාතික වගකීමක් ඉටුකරනු ලැබේ. දශක තුනක කාලයක් තුළ දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වූ උසස් තත්ත්වයේ වැඩසටහන් නිපදවමින් හා ප්‍රවෘත්ති සැපයීමෙන් ප්‍රේක්ෂකයින්ගේ රසඥතාව හා දැනුම ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හැකිව තිබේ. රටේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතා දැනුම්වත්භාවය ඉහළ නංවමින් ජාතික මාධ්‍ය ආයතනයක් ලෙස සිය මෙහෙවර සාර්ථකව ඉටුකොට තිබේ.

1.6.3 සී /ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

1979 දී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍ය ජාලයක් වශයෙන් කටයුතු කරමින් සිටී. සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) රජය සතුවූ පොදු සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ස්වාධීන රූපවාහිනීය ‘‘ITN’’ හා ‘‘වසන්තම් TV’’ ලෙස රූපවාහිනී නාලිකා දෙකක්ද ‘‘ITN FM’’ හා ‘‘වසන්තම් FM’’ ලෙස ගුවන් විදුලි සේවා දෙකක් ද පවත්වා ගෙනයනු ලැබේ. මෑත කාලීනව ඉතාමත් ප්‍රබල රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය ජාලය බවට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වර්ධනය වූ අතර, මුළු මහත් ශ්‍රී ලංකාව පුළුල්ව ආවරණය කෙරෙන ඉතා ප්‍රබල විකාශන ශක්තියක් සතු වේ. මුල් අවධියේ සිටම උසස් ප්‍රමිතියකින් යුතු වැඩසටහන් සිය ප්‍රේක්ෂක පිරිස වෙනුවෙන් පෙළගස්වන්නට ස්වාධීන රූපවාහිනිය සමත්වූ අතර ශ්‍රී ලාංකේය සංස්කෘතික, සමාජයීය හා ආගමික සාරධර්ම අනුගමනය කරමින් පවුලේ නාලිකාව ලෙස නමක්, ගරුත්වයක් හා ඉහළ පිළිගැනීමක් ද අත්කරගෙන ඇත.

1.6.4 සී /ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

“ලේක්හවුස්” නමින් ප්‍රචලිත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1926 දී ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද රජය සතු සීමිත සමාගමකි. 1973 අංක 28 දරණ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (විශේෂ විධිවිධාන) පනත අනුව එහි 88% ක හිමිකාරීත්වය රජය වෙනුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් දරයි. වර්තමානය වනවිට රටේ ප්‍රධානතම පුවත්පත් මුද්‍රණ ආයතනය ලෙස සිය ස්ථානය රැකගෙන සිටී.

අන්තර්ජාලය ජංගම දුරකථන තුළට පිවිසීමත් සමග ‘‘දිනමිණ’’, ‘‘ඩේලිනිවුස්’’ හා ‘‘තිනකරන්’’ පුවත්පත්වල ජංගම මෘදුකාංගයන් එළිදැක්වීමට ද කටයුතු කර ඇති අතර අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල තුළ ලේක්හවුස් වෙබ් පිටුව පරිහරණය කරන්නන්ට වැඩි විනෝදාස්වාදයක් ලබාදෙන අයුරින් පුවත් විකාශය කිරීමට කටයුතු කර ඇත. ශත වර්ෂයකට ආසන්න සිය ගමන් මග තුළ මාධ්‍ය කර්මාන්තයේ පෙරළිකරු ලෙස තම ස්ථානය තහවුරුකර ගැනීමට ලේක්හවුස් ආයතනය සමත්ව ඇත. ජාතික ආයතනයක් වශයෙන් මාධ්‍ය කර්මාන්තයේ මෙන්ම ජාතියේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම හා එම අරමුණු මත පදනම්ව ආයතනයේ අඛණ්ඩ වර්ධනයක් ළඟාකර ගැනීම ලෙක්හවුස් ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයයි.

1.6.5 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ කටයුතු කරන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පුවත්පත් නිදහස ආරක්ෂා කරගැනීම මෙම මණ්ඩලයේ ප්‍රමුඛ අරමුණ වන අතර, එම නිදහස අයුතු ලෙස භාවිතා කිරීම

වැළැක්වීම, පුවත්පත්වල අන්තර්ගතයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම, මහජනයා සතු සත්‍ය කරුණු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම යන අරමුණුද අවශේෂ අනෙකුත් අරමුණු අතර වැදගත් වේ. පුවත්පත් වාර්තාවල පළවන ඇතැම් විවාදාත්මක කරුණු සම්බන්ධයෙන් ආචාරධර්මානුකූලව මාධ්‍යවේදීන් හැඩගන්වමින් යම් නෛතික ප්‍රවේශ ඔස්සේ මාධ්‍යවේදීන් සඳහා මහපෙන්වීම මෙන්ම, මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඔවුන්ගේ වෘත්තීමය තත්ත්වය ඉහළ දැමීමටත් විශේෂ අවධානයක් යොමුකර ඇත.

පුවත්පත් විධිමත් කිරීම, පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළකිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියාකිරීමේ නිසි සම්බන්ධතාවයකට අනුබල දීම, පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, පත්‍ර කලාවේදී වෘත්තියට බඳවා ගැනීමේ ක්‍රම, සුබසාධනය අධ්‍යාපනය හා පුහුණුකිරීම් වැඩිදියුණු කිරීම හා පුවත්පත් පවත්වාගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද කටයුතු කිරීම පුවත්පත් මණ්ඩලය සතුකාර්යභාරය වේ.

1.6.6 සැලසිනේ රූපවාහිනී ආයතනය

එවකට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අනුබද්ධිතව 1982 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද සැලසිනේ රූපවාහිනී ආයතනය, 1997.06.09 දිනැති 979/2 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිට මේ දක්වා වරින් වර ජනමාධ්‍ය විෂය පථය අයත් අමාත්‍යාංශ යටතට ගැසට් කෙරුණි. මෙම ආයතනය මූලිකවම රාජ්‍ය දැන්වීම් පළ කරන ආයතනයක් මෙන්ම ඉසව් කළමනාකරණ ආයතනයක් ලෙසද ක්‍රියාත්මක වන ලදී. ස්වාධීන නෛතික ආයතනයක් ලෙස ස්ථාපිතවී නොමැති නමුදු, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්ට 100% ක හිමිකාරීත්වය සහිතව මෙම ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ව්‍යවස්ථාපිත වීම සඳහා වන කටයුතු අවසන් අදියරේ පවතී.

1.6.7 සී/ස ලංකා පුවත් සමාගම

ලංකාපුවත් ආයතනය ජාත්‍යන්තර පුවත් ඒජන්ත ආයතනවලට සමගාමීව 1978 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති නෛතික පුද්ගලභාවයක් ඇති ආයතනයකි. මෙම ආයතනය ලංකාවේ විදේශීය පුවත් ඒජන්සිය (Foreign News Agency) ලෙස විදේශීය රටවල පුවත් ඒජන්තවරුන් සමඟ කටයුතු කළ ද පසුගිය සිව්වසර පුරාවට මෙම ක්‍රියාවලිය අඩපණ වී ඇත. වර්තමානයේ ලංකා පුවත් ආයතනය බොහෝදුරට අක්‍රීය තත්ත්වයේ පවතින අතර මොබිටෙල් ආයතනය සමඟ ගිවිසුමකට එළඹ ඇති පරිදි කෙටි පණිවිඩ සේවාවක් (SMS Alert) පවත්වාගෙන යමින් ආයතනයේ වෙබ් අඩවියේද ප්‍රවෘත්ති යාවත්කාලීන කරනු ලැබේ. මෙම ආයතනය ආදායම් උපදවන ව්‍යාපාරික ඒකකයක් ලෙස ‘‘ලංකාපුවත්’’ යන නාමයෙන් ජාත්‍යන්තරයට හඳුන්වාදීම සඳහා පුළුල් කිරීමට යෝජනා වී ඇත.

1.6.8 ශ්‍රී ලංකා පදනම් ආයතනය

ශ්‍රී ලංකා පදනමේ ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය වූ කලී සමාජ ඒකාබද්ධතාවය සහ සමාජ ප්‍රගමනය යන විශේෂිත ශික්ෂණයන් මාලාවක් කේන්ද්‍රගත කරගනිමින් සේවය සලසන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ වැඩිහිටි අධ්‍යාපන ආයතනයකි. 1963 වසරේ අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් නීතිය යටතේ පිහිටනු ලැබීමෙන් අනතුරුව මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, සාමය සහ ප්‍රතිසන්ධානය යන ශික්ෂණයන් අනුක්‍රමිකව සහ මනාව අනුගත කර ගැනීමේ හේතුවෙන් ප්‍රකාශයට පත් ව ඇති ඉන් පිළිබිඹු කෙරෙන්නේ අද්විතීය ආකාරයේ ආදර්ශයකි.

ශ්‍රී ලංකා පදනම් ආයතනය සිය අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් මගින් රටෙහි බලපාන අධ්‍යයතන සමාජ, දේශපාලන, ආර්ථික හා ආර්ථික සන්ධර්භයන්හි ගැටළු වලට පිළියම් සැලසීමට උපකාරී වෙමින් ජාතික කේන්ද්‍රීය ස්ථානයක් වශයෙන් දේශයට මෙහෙවරක් ඉටුකරමින් සිටී. සිවිල් අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි සිය විශේෂ අවධානය යොමුකරන අතරම ශ්‍රී ලංකා පදනමේ ප්‍රධාන අරමුණ වන්නේ ගෝලීය හා ජාතික වැදගත්කමකින් යුතු විවිධ අධ්‍යාපනික අවශ්‍යතා කෙරෙහි සිය එල්ලය යොමු කිරීමය. ශ්‍රී ලංකා පදනම පනතද කාලීන අවශ්‍යතාවයන්ට අනුව සංශෝධනයට ලක්විය යුතු බව හඳුනාගෙන ඇති අතර පනත කෙටුම්පත් කරමින් පවතී.

1.6.9 ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය යනු ශ්‍රී ලංකාවේ මුද්‍රණ සහ ග්‍රැෆික් කලා කර්මාන්තයේ දැනුම, කුසලතා සහ ප්‍රවීණත්වයේ උන්නතිය සඳහා කැපවී සිටින පුරෝගාමී ව්‍යාත්තීය ආයතනයයි. එවක තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ 1984 පාර්ලිමේන්තු පනතක් මගින් මෙම ආයතනය පිහිටුවන ලදී. විද්‍යාත්මක හා තාක්ෂණික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සහ මුද්‍රණ සහ ග්‍රැෆික් කලා කර්මාන්තයේ දැනුම සහ කුසලතා සඳහා දිනෙන් දින පුළුල් වන අවශ්‍යතාවය සපුරාලීම සඳහා කැප වූ ස්වයං අරමුදල් උත්පාදිත, ලාභ නොලබන ආයතනයක් වන මෙහි විශේෂ කාර්යය වන්නේ රටේ සමාජ-ආර්ථික ප්‍රගතියේ සන්දර්භය තුළ නවීකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා මුද්‍රණ කර්මාන්තයට සහාය වීමයි.

1.6.10 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී. ව්‍යවස්ථාපිතව ස්වාධීන ආයතනයක් වන අතර තොරතුරු පනතේ විධිවිධාන වලට අනුකූල නොවීම පිළිබඳ පැමිණිලි විභාග කිරීමේ හිමිකම ඇති අතර එහි විධිවිධාන උල්ලංඝනය කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමෙහිලා නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ද සහිතය. තවද පනත මගින් නිර්මිත වැරදි සිදුකරන්නවුන්ට එදිරිව නඩු පැවරීමේ බලය එයට පවතී.

පනත යටතේ පොදු අධිකාරීන් මගින් සිය රාජකාරිවලට අනුගතව කටයුතු කරන්නේදැයි ඇගයීමේ කාර්ය කොමිෂන් සභාව සතු වන අතර යම් පොදු අධිකාරියක් සඳහා අවශ්‍ය කරන්නා වූ සාමාන්‍ය ප්‍රතිසංස්කරණ මෙන්ම විශේෂිත වූ ප්‍රතිසංස්කරණද සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් තොරතුරු නිදහස් කිරීම සඳහා රාජ්‍ය ආයතන වෙත සාධාරණ ගාස්තු තීරණය කිරීම සම්බන්ධ උපදෙස් නිකුත් කිරීමටත්, නොමිලයේ තොරතුරු නිදහස් කළ යුතු අවස්ථා නිර්දේශ කිරීමටත්, ගාස්තු උපලේඛනය නිර්දේශ කිරීමටත්, රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය / හැසිරවීමටත්, පනත යටතේ හිමිකම් සහ අවශ්‍යතා ප්‍රසිද්ධ කිරීමටත් එමෙන්ම රජයේ ආයතන විසින් නිසි පරිදි වාර්තා තබා ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ උපදෙස් මාලා නිකුත් කිරීමටත් කොමිෂන් සභාව බැඳී සිටී.

මෙම පනත යටතේ අභියාචනා විභාග කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ලැබී ඇත. මෙයට යම් පුද්ගලයකු දිවුරුමකින්/ ප්‍රතිඥාවක් මත පරීක්ෂාවට ලක් කිරීමටත් ඔහුගේ/ ඇයගේ සන්තකයෙහි පවත්නා ඕනෑම තොරතුරක් ඉදිරිපත් කිරීම එකී පුද්ගලයාගෙන් සිදුකරවීමට බලය පවතී. (විශේෂිත කරන ලද තොරතුරු පරීක්ෂණයට බඳුන් කිරීම රහස්‍යව සිදු කරනු ලැබේ). පනතින් විශේෂිත කරන ලදුව ආවරණය කරන ලද තොරතුරුද ඇතුළු ඕනෑම රාජ්‍ය ආයතනයක පවත්නා තොරතුරක් පරීක්ෂා කිරීමේ හිමිකම කොමිෂන් සභාව සතුය. යම් ආකාරයකින් තොරතුරු සැපයීම සඳහා යම් රජයේ ආයතනයකට උපදෙස් දීමට කොමිෂන් සභාවට හැකියාව ඇති අතර මහජනතාවට ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටි තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට (විශේෂිත වූ කරුණු හැර) යම් රාජ්‍ය ආයතනයක් යොමුකිරීමේ හැකියාව සහිතය. යම් තොරතුරක් ලබාදීම ප්‍රමාද කිරීම කරණ කොට ගනිමින් යම් පුරවැසියකුගෙන් අයකරන ලද යම් මුදලක් නැවත ලබාදීම සඳහා යම් රාජ්‍ය ආයතනයක් යොමු කිරීමටද කොමිෂන් සභාවට හැකියාව පවතී. (15 වන වගන්තිය)

1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

1.7.1 අ) ව්‍යාපෘතියේ නම : ගැටුම්වලින් බලපෑමට ලක්වූ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ස්විස්ටර්ලන්ත රජය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රුපියල් මිලියන 4.5

ඈ) ව්‍යාපෘති කාලය : 2018 මැයි – 2021

1.7.2 අ) ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ජපන් යෙන් මිලියන 17,717

(JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක්ද රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක්ද වශයෙනි.)

ඈ) ව්‍යාපෘති කාලය : 2021 – 2028

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

2.1.1 "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජනමාධ්‍ය ප්‍රතිපත්තියෙහි සඳහන් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

i) "ඇසි දිසි පෙරමග" - සෞභාග්‍යයේ පුනරුදය

නව රජයේ ''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතන විසින් රටේ සංවර්ධනයටත්, ජනතා සුබ සාධනය වෙනුවෙන් ඉටුකරනු ලබන හා ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා, "ඇසිදිසි පෙරමග" සෞභාග්‍යයේ පුනරුදය නමින් ප්‍රචාරක වැඩසටහනක් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් දියත් කර ඇත. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශයීය විෂය යටතේ පවතින රාජ්‍ය විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන මෙන්ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවද ක්‍රියාකාරීව දායකවේ. මීට අමතරව පෞද්ගලික මාධ්‍ය ආයතන ද මේ සඳහා සම්බන්ධ කර ගෙන ඇත.

මෙම ව්‍යාපෘතියේ අරමුණු,

- රජය විසින් ඉටු කරනු ලබන, ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- සංවර්ධන පුවත් සඳහා මාධ්‍ය තුළ සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් ලබාගැනීම.
- සංවර්ධන පුවත් ජනගත කිරීම පිළිබඳව මාධ්‍යවේදීන් හා මාධ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.
- මාධ්‍ය මගින් දැනුවත් කිරීම තුළින් සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රතිලාභීන් ස්ථිරවම එම ක්‍රියාවලිය තුළට දායක කරගැනීම.

වත්මන් ජනමාධ්‍ය භාවිතය තුළ විවිධ අවස්ථාවන් වලදී ජන සමාජයේ ප්‍රගමනයට බාධා වන අයුරින් ජනතාව වෙත තොරතුරු මුදාහැරීම සිදුකරන බැවින් එම තත්ත්වය මගහැරවීම සඳහා නිවැරදි සංවර්ධන තොරතුරු ජනතාව වෙත ලබා දීමත් ඒ සඳහා මුලු රාජ්‍ය යාන්ත්‍රණයේම සහාය ලබාගැනීමත් මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

ඒ අනුව, කර්මාන්ත, සංචාරක හා විදුලි බල යන අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ කිහිපයක ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව , ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය මඟින් ''සංවර්ධන පුවත් ජනගත කිරීමේ ඒකාබද්ධ ප්‍රචාරක වැඩසටහන'' යටතේ ප්‍රචාරය සිදු කරන ලදී.

ii) ***පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පවතින නිරෝගී ලක්ෂණයක් නම් අන්තර්ජාතික සම්මුතීන් විසින් පිළිගන්නා භාෂණයේ හා ප්‍රකාශනයේ ඇති නිදහසය. ජනතාවට නිවැරදි දේශපාලන ආර්ථික සහ සමාජීය තීරණ ගැනීමට හැකිවන්නේ ඔවුන් නිවැරදි තොරතුරුවලින් හා දැනුමෙන් සන්නද්ධ වූ විටය. ඒ සඳහා බාධා විරහිත ව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවකාශ තිබිය යුතුය.***

ඒ අනුව අමාත්‍යාංශය විසින් තව දුරටත් තොරතුරු දැනගැනීමේ පනත අනුව කටයුතු කරයි. තවද නිවැරදි තොරතුරු මහජනතාව වෙත රැගෙන යාම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සන්නද්ධ කිරීමට කටයුතු කරන ලද අතර සියළු ජන කොටස් සඳහා නිවැරදි තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි ආවරණ කලාප පුළුල් කිරීමට කටයුතු කරන ලදී.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017 පෙබරවාරි මස 03 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ විය. රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත්, එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව, සක්‍රීය ලෙස දායක විය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ නිල වෙබ් අඩවිය (www.rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම මගින් පුරවැසියන්ට ඵලදායී ලෙස තොරතුරු අයිතිවාසිකම් පනත භාවිතයට ගැනීම, තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පුරවැසියන්ගේ දැනුවත්භාවය වැඩිකිරීම හා තොරතුරු ඉල්ලීම් මඟින් මහජන අවශ්‍යතා සැපයීම ද මෙහි අරමුණු වේ. මෙහිදී තොරතුරු අයිතිවාසිකම් සම්බන්ධ නිල පුවත් පල කිරීම සහ ඉදිරියේදී පැවත්වෙන වැඩසටහන් සම්බන්ධයෙන් වන ප්‍රචාරණය වැදගත් වෙයි. එමෙන්ම තොරතුරු අයිතිවාසිකම සම්බන්ධයෙන් ඉතා ක්‍රියාශීලී මෙන්ම වඩාත් ඵලදායී ලෙස භාවිතා කළ හැකි අයුරින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදුවෙයි. 2021.12.31 දින වන විට වෙබ් පරිශීලකයන් 150,383 ක් වේ.

තොරතුරු කොමිෂන් සභාව හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීමේදී තොරතුරු අයිතිවාසිකම් පනත ප්‍රකාරව සහ තොරතුරු ඉල්ලීමේ ක්‍රමවේදයට අනුව කොමිෂන් සභාව සමඟ අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරන ලදී. මේ වන විට වාර්ෂික වාර්තා, මාසික තත්ත්ව වාර්තා 203 ක් තොරතුරු කොමිසම වෙත යොමු කරන ලදී.

එමෙන්ම පුරවැසියන් හෝ පොදු අධිකාරීන් විසින් කොමිෂන් සභාව වෙතින් ඉටුකර ගත යුතු කාර්යයන් සම්බන්ධව සහ තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාවේ විවිධ ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමු කිරීම සිදු කරන ලදී.

2021.12.31 දින වන විට දෛනිකව තොරතුරු අයිතිවාසිකම් පනත හා සම්බන්ධ ගැටලු ඉදිරිපත් කරන ලද අතර 100 කට ආසන්න පුද්ගලයින් සංඛ්‍යාවක් සඳහා විධිමත් උපදේශන ලබාදී ඇත. මෙහිදී පුරවැසියන්ට තොරතුරු පනත සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම මෙන්ම තොරතුරු

අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට පැමිණෙන පුරවැසියන් දැනුවත් කිරීම මූලික අරමුණු වේ.

තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ විද්‍යුත් තැපෑල (info@rti.gov.lk) පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම තුලින් පුරවැසියා විද්‍යුත් තැපෑල මඟින් යොමු කරන ලද තොරතුරු ඉල්ලුම් පත්‍ර අදාළ ආයතන වෙත යොමු කර ඇත. එමෙන්ම පුරවැසියන්ට සහ පොදු අධිකාරීවල නිලධාරීන්ට ඇතිවන ගැටළු සඳහා පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරන ලද විද්‍යුත් ලිපි සඳහා පිළිතුරු ලබාදීම සිදුකර ඇත.

විශේෂයෙන්ම තරුණ ප්‍රජාව ඉලක්ක කොට ගනිමින් සහ පුරවැසියන් සඳහා තොරතුරු අයිතිවාසිකම් පනත පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන RTI face book පිටුව මඟින් ආකර්ෂණීය ලෙස තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව දැනුවත් කිරීම සිදු කෙරේ. පුද්ගලයින් 3000 ක් මෙම පිටුව පරිශීලනය කොට ඇත. මෙය දෛනිකව යාවත්කාලීන කෙරේ.

තොරතුරු දැනගැනීමේ පනතට අදාලව තොරතුරු නිලධාරියාගේ හා නම්කල නිලධාරීන්ගේ මාර්ගෝපදේශ සංග්‍රහයක් ආයතන වෙත බෙදා හැරීම සිදු කෙරේ. එමෙන්ම මේ වන විට අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පිටපත් 1780 ක් බෙදා හැරීම සිදු කර ඇත. මීට අමතරව අනෙකුත් පොදු අධිකාරීන් සඳහා මෙම ලේඛන බෙදා හැරීමට නියමිතය. ප්‍රකාශන බෙදාහැරීම තුළින් ආයතනයන්හි තොරතුරු නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම අරමුණ වේ.

පොදු අධිකාරීන්හි අලුතින් පත්කරන ලද තොරතුරු නිලධාරීන් සහ අභියාචනා නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් (Data Base) වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති අතර දෛනිකව එය යාවත්කාලීන කරනු ලැබේ. 2021.12.31 දින වන විට තොරතුරු නිලධාරීන් 3005 ක තොරතුරු දත්ත පාදකයට ඇතුළත් කොට ඇත.

‘‘දිනමිණ’’ හා ‘‘තිනකරන්’’ පුවත්පත් සමඟ මාසික පුවත්පත් අතිරේකයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ‘‘පවත’’ පුවත්පත් අතිරේකය සිංහල හා ද්‍රවිඩ භාෂාවලින් මේ වන විට වසර 02 කට ආසන්න කාලයක් ප්‍රකාශයට පත් කර ඇත. සැප්තැම්බර් 28 දිනට යෙදෙන ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම් දිනය නිමිත්තෙන් ‘‘පවත’’ පුවත්පතේ සුවිශේෂී කලාපයක් ප්‍රකාශයට පත්කරන ලදී.

තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා විවිධ ආයතනවලින් කරනු ලබන ඉල්ලීම් සඳහා සම්පත්දායකයින් යොමු කිරීමද අඛණ්ඩව සිදු කෙරේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ සියළුම කැබිනට් අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරී, වැනි පොදු අධිකාරීන් නියෝජනය වන පරිදි තොරතුරු නිලධාරීන් 150 ක් සඳහා වැඩසටහන් 03 ක් Afriel තරුණ ජාලයේ මූල්‍යමය දායකත්වයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ පවත්වන ලදී. මීට අමතරව පුහුණුකරුවන් පුහුණු

කිරීමේ වැඩසටහන් 02 ක් සහ තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 22 ක් 2022 වර්ෂයේදී පැවැත්වීමට නියමිතය.

iii) විසි එක්වැනි සියවසට ගැළපෙන සමාජයක් නිර්මාණය කරනු පිණිස භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඉහළින් ම පිළිගන්නා අතර ඒවා රැක ගැනීම පිණිස උපරිමයෙන් ක්‍රියා කෙරේ. ඒ සඳහා ජනමාධ්‍ය ආයතන හා එහි සේවයේ නියුතු වෘත්තීයවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම.

ජනමාධ්‍යවේදීන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දීම - "ඇසිදිසි" රක්ෂණාවරණය

රටක තොරතුරු සම්ප්‍රේෂණ කාර්යභාරයෙහිලා ජනමාධ්‍යවේදීන් විසින් සිදු කරනු ලබන්නේ සුවිශේෂී කාර්යභාරයකි. නව මාධ්‍ය බිහිවීමත් සමග මාධ්‍ය ක්ෂේත්‍රයෙහි වපසරිය තවත් පුළුල් වූ අතර තාක්ෂණික වශයෙන් හා නිර්මාණාත්මක වශයෙන් ද විශාල දියුණුවක් අත්පත් කරගෙන තිබෙන මෙම ක්ෂේත්‍රය තුළ විවිධ අංශ ඔස්සේ මාධ්‍යවේදීන් තම මෙහෙවරෙහි නියැළෙති.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රකාශනයෙහි, ජනතාවට නිවැරදි දේශපාලන, ආර්ථික සහ සමාජීය තීරණ ගැනීමට හැකිවන්නේ ඔවුන් නිවැරදි තොරතුරුවලින් සහ දැනුමෙන් සන්නද්ධ වූ විට බවත්, ඒ සඳහා බාධා විරහිතව තොරතුරු, දැනුම සහ මතවාද සන්නිවේදනයට අවකාශ තිබිය යුතු බවත් අවධාරණය කර ඇත.

ජනතාව දැනුම්වත් කිරීමේ ජාතික වගකීමට උරදී සිටින රට පුරා ව්‍යාප්ත සියලු මාධ්‍යවේදීන්ට තම කාර්යය මනාව ඉටු කිරීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික හා රාජකාරීමය දිවියේ සුරක්ෂිතභාවයක් හා විශ්වසනීයභාවයක් පැවතිය යුතුවේ. කැරලි-කෝලහාල, හදිසි ආපදා තත්ත්ව වාර්තාකරණයේදී බහුතරයකට තම දිවි පරදුවට තබා මාධ්‍යකරණයේ නියැලීමට සිදුවී ඇත. මාධ්‍යවේදීන් විසින් සිදුකරනු ලබන මෙම ප්‍රමුඛතම කාර්යභාරය අවබෝධ කරගත් මෙම අමාත්‍යාංශය ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් "ඇසිදිසි" රක්ෂණාවරණය හඳුන්වාදීම සඳහා කටයුතු කරන ලදී.

රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනයන්හි බොහෝ මාධ්‍යවේදීන්ට යම් රක්ෂණාවරණ ක්‍රමයක් පැවතිය ද, නිදහස් හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් බහුතරයකට කිසිදු රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළ දැනට ස්ථාපිත වී නොමැත. මේ කරුණු සලකා නේවාසික ප්‍රතිකාර, හදිසි අනතුරු රක්ෂණාවරණයක්, ශල්‍යකර්ම සහ අසාධ්‍ය රෝග ආවරණයන් ඇතුළු සුවිශේෂී ප්‍රතිලාභවලින් සමන්විත "ඇසිදිසි" රක්ෂණාවරණය මාධ්‍යවේදීන්ට හඳුන්වා දෙන ලදී.

මෙම රක්ෂණාවරණ යෝජනා ක්‍රමයට 2021 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 100 ක් වෙන් කර ඇති අතර මාධ්‍ය ක්ෂේත්‍රයේ නියුතු ජනමාධ්‍යවේදීන් 3844 කට පමණ මෙම යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ඔප්පු ලබා දීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත. මේ සඳහා වූ පිරිවැය රු.මි. 99.93 කි.

iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සමකාලීන ගෝලීය වර්ධනය සමඟ ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රයට ඇති සබඳතා පිළිබඳ අවබෝධයෙන් යුතුව මාධ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණය පිළිබඳව ඇති ජාතික හා අන්තර් ජාතික අණපනත්, ජාතික හා අන්තර්ජාතික මාධ්‍ය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය සහ සමාජ සංස්කෘතික අනන්‍යතා යන ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානය යොමු කිරීම.

අන්තර්ජාතික අණපනත්, ජාතික හා අන්තර්ජාතික මාධ්‍ය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සලකා බලමින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනයන්, සමාජ, සංස්කෘතික අනන්‍යතා යන ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කිරීමට යොමු කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර විධිමත් කිරීම සඳහා නව විකාශන කොමිෂන් සභාවක් ඇති කිරීමට කටයුතු කිරීම.

v) ජනමාධ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සංස්කෘතිය, සමාජය, පවුල හා මනුෂ්‍ය සබඳතා පිළිබඳ පිළිගත් සමාජ සංස්කෘතික වටිනාකම් හා සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයනු පිණිස අවබෝධාත්මකව කටයුතු කිරීම.

අමාත්‍යාංශය විසින් ආචාර ධර්ම පද්ධතිය සකස් කිරීම ආරම්භ කර ඇත.

අ) රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීම නියාමනය කිරීම

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන විෂයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ පිළිවෙලින් 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. යථෝක්ත පනත්වල තිබෙන්නාවූ ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව එම ආයතන විෂයභාර අමාත්‍යවරයාට හිමිවන බලතල ප්‍රකාරව පෞද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා දීම ද සිදු කළ හැක.

මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීමය.

2021 දෙසැම්බර් 31 දිනවන විට ක්‍රියාකාරීව පවතින පෞද්ගලික රූපවාහිනී හා ගුවන් විදුලි බලපත්‍ර සංඛ්‍යාව හා නාලිකා සංඛ්‍යාව

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී පෞද්ගලික ආයතන සංඛ්‍යාව	පෞද්ගලික නාලිකා සංඛ්‍යාව
ගුවන්විදුලි	18	36
භෞමික රූපවාහිනී	16	20
එකතුව	**34**	**56**

තවද රාජ්‍ය මාධ්‍ය ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රාදේශීය සේවාවන් ද ඇතුළුව ගුවන් විදුලි නාලිකා 15 ක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන රාජ්‍ය මාධ්‍ය ආයතන දෙක ඔස්සේ රූපවාහිනී සේවාවන් 05 ක් ද පවත්වාගෙන යනු ලැබේ.

මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර අනුව ක්‍රියාත්මක සේවා සපයන ආයතන සංඛ්‍යාව පහත පරිදි වේ.

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව
කේබල් රූපවාහිනී	04
චන්ද්‍රිකා රූපවාහිනී	03
අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී	02
ජංගම දුරකතන මත පදනම් වූ රූපවාහිනී	01
එකතුව	**10**

ඒ ඒ කාලයන්හි උචිතයැයි හැඟෙන කොන්දේසි වරින් වර රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර ආකෘතියට එක්කිරීම හේතුවෙන් නිකුත් කර ඇති බලපත්‍රයන්හි කොන්දේසි එකිනෙකට වෙනස් වන බැවින් මෙම නිකුත් කළ බලපත්හි ඒකාකාරීත්වයක් නොමැති වීම, එම බලපත්‍රයන්හි කොන්දේසි වර්තමානයට උචිත වන පරිදි සංශෝධනයන් සිදු නොවීම, ඩිජිටල් තාක්ෂණයට උචිත පරිදි සකස් කිරීම හා බලපත් කොන්දේසි නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම යන ගැටළු සලකා බලා එයට විසඳුමක් ලෙස 2017.10.25 දින පත්කරන ලද ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන ආයතන වෙත නිකුත් කර ඇති බලපත් නියමානුකූල කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ලබාදුන් කමිටුව විසින් ‘‘විකාශන නියාමන කොමිෂන් සභා පනත’’ දළ කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව ලබා දී ඇති තීරණය අනුව විද්වත් කමිටුවක් හරහා සමාලෝචනය කරන ලදී. මෙහිදී උද්ගත වූ ගැටලුකාරී තත්ත්වයන්ට විසඳුමක් ලෙස ‘‘ශ්‍රී ලංකා විකාශන නීතිය’’ කෙටුම්පත් කරන ලදී.

ආ) ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

අංක 12/1037/37/019-1 සහ 13.08.2012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සියලුම ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රු.25,000.00 ක් වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරීම සඳහා රු. 10,000.00 ක මුදලක් ද අමාත්‍යාංශය වෙත බැර කළ යුතුය. 2021 දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ප්‍රවෘත්ති වෙබ් අඩවි සංඛ්‍යාව 220 කි. 2020 වසරට අදාළව නව වෙබ් අඩවි 24 ක් ලියාපදිංචි කර ඇති අතර අලුත් කිරීම් 27 ක් සිදු කර ඇත.

ඇ) ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මඟින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා රූපවාහිනී නාලිකා මඟින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ. මෙම බදු 2017-11-07 දින නිකුත් කරන ලද අංක 2044/21 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව වූ 2017 අංක 1 දරණ මුදල් (ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද) නියෝගවල 13 වැනි නියෝගයෙහි විධිවිධානවලට අනුකූලව ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ නිශ්කාෂණ සහතිකයක් නොලබා කිසිදු බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් ටෙලි නාට්‍යයක්, චිත්‍රපටියක් හෝ වාණිජ වැඩසටහනක් විකාශය නොකළ යුතුය. ඒ අනුව ආනයනය කර මෙරට විකාශනය කිරීමට අපේක්ෂිත ටෙලි නාට්‍ය චිත්‍රපට හා වාණිජ වැඩසටහන්, අමාත්‍යාංශ ලේකම් විසින් පිහිටුවනු ලබන අධීක්ෂණ මණ්ඩලයක් මගින් අධීක්ෂණයට ලක් කෙරේ.

2021 දෙසැම්බර් 31 දින දක්වා ආනයනික ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන් 2581 ක්ද, චිත්‍රපට 103 ක්ද, හා වාණිජ වැඩසටහන් 135 ක්ද මගින් අයකර ගනු ලැබූ බදු මුදල රු.මි. 438.47 කි. එය මහා භාණ්ඩාගාර අරමුදලට බැර කරන ලදී. ආනයනික ටෙලි නාට්‍ය හා වාර්තා වැඩසටහන් 602 ක් සහ චිත්‍රපට 633 ක් බද්දෙන් නිදහස් කර ඇත. මේ අනුව නිශ්කාෂණ සහතිකපත් 4054 ක් නිකුත් කර ඇති අතර මෙම කාර්යය සඳහා අධීක්ෂණ මණ්ඩල සාමාජිකයන් 29 දෙනෙකු සම්බන්ධ කර ඇති අතර දෛනිකව තිදෙනා බැගින් වන අනු කමිටු වාර 258 ක් මඟින් විකාශන අනුමැතීන් ලබාදී ඇත.

vi) ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයින් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම.

අ) "ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය" පිහිටුවීම

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ජනමාධ්‍ය ප්‍රතිපත්තියට අනුව ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය අනුග්‍රහය සහිත ජනමාධ්‍ය උසස් අධ්‍යාපන පර්යේෂණ හා පුහුණු ආයතනයක් ආරම්භ කිරීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය : Chartered Institute of Journalists - Sri Lanka යන නාමයෙන් ජනමාධ්‍ය උසස් අධ්‍යාපන පර්යේෂණ සහ පුහුණු ආයතනයක් පිහිටුවීම යන මැයෙන් 2021 සැප්තැම්බර් මස 21 වන දින ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

නීත්‍යානුකූලව පිළිගත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලබන මෙම උසස් අධ්‍යාපන පර්යේෂණ හා පුහුණු ආයතනය හරහා වර්තමානයේ ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පවතින ගැටලු හඳුනාගෙන මාධ්‍ය සංස්කෘතිය, මාධ්‍ය සම්ප්‍රදාය රටට සුබදායී ලෙස මෙහෙයවීමට හැකි හා සදාචාරාත්මක ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීමට අපේක්ෂා කෙරේ.

වර්තමානයේ මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලෙන රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍යවේදීන්ට මෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ඨ වීමට අපේක්ෂාවෙන් සිටින ආධුනිකයන්ට ද ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට ආයතනය මඟින් මග පෙන්වනු ලැබේ. පිළිගත් වෘත්තීය මාධ්‍යවේදියකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගිකව ලබාදීමට මෙම ආයතනය මඟින් සිදු කරනු ඇත.

උසස් අන්තර්ගතයකින් සමන්විත පාඨමාලා මඟින් භාෂා දැනුම, ලේඛන හැකියාව, නිර්මාණශීලීත්වය යන පැතිකඩයන් ද පුළුල්ව ආවරණය කරමින් මාධ්‍යකරණයේ නිවැරදිව නිරත වන වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම සහ වෘත්තීමය වශයෙන් සෑමවිටම වටිනාකමක් ලැබෙන මාධ්‍යවේදීන් බිහි කිරීම මෙම ආයතනයේ අරමුණු අතර වේ. අනාගතයේදී රැකියා අපේක්ෂාවෙන් බලා සිටින රැකියාවක් සහිත මාධ්‍යවේදීන් වෙනුවට ස්වෝත්සාහයෙන් රැකියා අවස්ථා නිර්මාණය කරගනු ලබන ව්‍යවසායකයකු ලෙස ගොඩනැගිය හැකි න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුම ලබාදීම ආයතනයේ ප්‍රධානතම අරමුණක් ලෙස හැඳින්විය හැක.

මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත්, නව/ සමාජ මාධ්‍ය (New Media/Social Media) යන ප්‍රධාන විෂය ධාරාවන් ආවරණය වන ලෙස අධ්‍යනාංශ හඳුනාගෙන ඇත. අරම්භක දින සිට ඉදිරි දෙවර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති අතර ඊට අදාලව වැඩමුළු, සහතිකපත්‍ර පාඨමාලා (Certificate Courses), ඩිප්ලෝමා (Diploma), උසස් ජාතික ඩිප්ලෝමා (Higher National Diploma-HND) යන පාඨමාලා හඳුනාගනිමින් පත් කරන ලද විෂය නිර්දේශ සකස් කිරීමේ කමිටුව විසින් එම පාඨමාලා සඳහා විෂය නිර්දේශ (syllabus) මේ වන විට සකස් කරමින් පවතී. යෝජිත ආයතනය සඳහා අදාළ ආයතන කෙටුම්පතද සකස් කර ඇත. මෙමඟින් වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවීම් සඳහා ඉඩ ප්‍රස්තා වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ආයතනය හුදෙක් තවත් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් නොකර දැනුමින්, හැකියාවෙන් පරිපූර්ණ දක්ෂ පිළිගත් මාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් අනාගතයේදී දැයට දායාද කිරීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

ආ) "ඇසිදිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තියභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන වාර්ෂිකව ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවනු ලැබේ.

වසර තුනක සේවා කාලය සපුරා ඇති, දිවයිනේ පිළිගත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනම මත සේවයේ නියැලී සිටින වයස අවුරුදු 18-55 ත් අතර මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හා වෙබ් මාධ්‍යවේදීන්ට මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම් කළ හැකිය.

තවද ඉල්ලුම් කරන පාඨමාලාව සෘජුවම ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් වියයුතු අතර අයදුම්කරුවන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරනු ලබන ජනමාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය.

ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් ලක්ෂ 01 කටද, උපාධිය/ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් ලක්ෂ 2 ක උපරිමයකටද, යටත්ව ලබාදෙන මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මඟින් මාධ්‍යවේදීන්ට දෙවරක් ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසේ. පළමු අවස්ථාවේ සුදුසුකම් ලබා පාඨමාලාව සම්පූර්ණ කර වසර 05 ක් ඉක්ම ගිය පසු දෙවන අවස්ථාව සඳහා අයදුම් කළ හැක.

මෙම වැඩසටහන 2006 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වෙයි. 2021 වර්ෂයේ මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 7.5 ක් ලබාදී ඇත. 2021 වර්ෂයේ ශිෂ්‍යත්වලාභීන් 116 ක් සඳහා රු. මිලියන 6.55 ක ගෙවීම් සිදුකර ඇත.

vii) පුවත්පත්, ගුවන් විදුලි සහ රූපවාහිනී මාධ්‍ය ආයතන ආරම්භ කිරීමේ දී එහි මූල්‍ය ආයෝජනයන් පිළිබඳ රජයේ අවධානය යොමු කෙරේ. එම ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන රජයේ අධීක්ෂණයට ලක් කරන අතර එය නව නීති රීති මඟින් නියාමනය කිරීම.

රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර නිකුත් කිරීමේදී හා වෙබ් අඩවි ලියාපදිංචියේදී බලපත්‍ර ඉල්ලුම් කරන ආයතන පිළිබඳව ආරක්ෂක නිශ්කාශන ලබාගැනීම අත්‍යවශ්‍යය.

තවද මාධ්‍ය ආයතනයන්හි ආයතන සංයුතිය සම්බන්ධව ආරක්ෂක නිශ්කාශන ලබාගැනීම අනිවාර්ය කර ඇත.

viii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වාණිජ තරඟකාරිත්වයේ පීඩනයෙන් තොරව ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ආදර්ශ ඉදිරිපත් කිරීම සඳහා සරිලනසේ ක්‍රියාකරන ආයතන බවට පත්කර පාර්ලිමේන්තුවට වගකියන කොමිෂන් සභාවක් යටතට පැමිණවීම.

මෙම ආයතන සෘජු අධීක්ෂණයට ලක් කරමින් ආයතනයන්හි වැඩසටහන් වර්තමාන සමාජයට ගැළපෙන පරිදි ගුණාත්මකභාවය වැඩිකිරීම සඳහා මඟ පෙන්වීම, ආයතනයන්හි තාක්ෂණික වැඩිදියුණු කිරීම්වලට ප්‍රතිපාදන සලසා දීම සහ එම ආයතන නූතන තාක්ෂණයට අනුගත වන ලෙස නව මාධ්‍ය වෙත පිවිසීමට යොමු කිරීම, ආයතන සිය ගුණාත්මක වැඩසටහන් මඟින් ලාභ සමච්ඡේද ලක්ෂ්‍යට පිවිසීමට හැකිවන ලෙස ව්‍යාපාරික සැලැසුම් හා පස් අවුරුදු සැලැසුම් සකස් කිරීම සිදු කර ඇත.

ix) පුවත්පත් මණ්ඩලය ව්‍යූහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙස ද මාධ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස ද ප්‍රතිසංවිධානය කිරීම.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විදුහුත් මුද්‍රිත සහ නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 1973 අංක 05 දරණ පුවත්පත් මණ්ඩල පනත සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා පුවත්පත් මණ්ඩලය විසින් මහජන කතිකාවතක් ඇති කරමින් පවතී. තවද මාධ්‍යවේදීන්ගේ අදහස් ලබාගැනීමට සම්මන්ත්‍රණ පැවැත්වීමට සැලසුම් කර ඇත.

x) ජනමාධ්‍යවේදීන් සඳහා නාගරික නිවාස සංකීර්ණයක් ගොඩනැගීමට කටයුතු කෙරෙන අතර සහන වාහන ණය ක්‍රමයක් හඳුන්වාදීම

ජන**මාධ්‍යවේදීන්**ගේ අවශ්‍යතා පිළිබඳව පුවත්පත් හා වෙබ් අඩවිය ඔස්සේ කැඳවන ලද තොරතුරු, දත්ත පද්ධතියක් වෙත ඇතුළත් කරමින් පවතී.

xi) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ද ඇතුළුව මාධ්‍යවේදීන්ට පහසුකම් සලසා දීම උදෙසා පුළුල් පහසුකම් සහිතව "ජනමාධ්‍ය ස්ථාගාර" (Press Club) ක්‍රමයක් පළාත්බදව පිහිටුවීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ ප්‍රාදේශීය වශයෙන් ''ජනමාධ්‍ය ස්ථාගාර'' පිහිටුවීමට සාකච්ඡා කර ඇත. මූලික වශයෙන් බස්නාහිර පළාත ආවරණය වන පරිදි මූලාරම්භයක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ජනමාධ්‍ය ස්ථාගාරයක් පිහිටුවීමට අපේක්ෂිතය.

xii) සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම, අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කරනු පිණිස අවශ්‍ය පියවර ගැනීම

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව ජනතාවගේ මාධ්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් උසස් පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ඉගැන්වීමේ නියැලෙන ගුරුවරුන් හා සිසුන් සඳහා ''වත්මන් මාධ්‍ය ප්‍රවණතා'', ''මාධ්‍ය සාක්ෂරතාවය හා නිර්මාණාත්මක භාවිතය'', ''නිර්මාණාත්මක සන්නිවේදනය හා මාධ්‍ය භාවිතය'', ''මාධ්‍ය සංස්කෘතිය හඳුනාගැනීම හා එහි වැදගත්කම'', ''සන්නිවේදන ආකෘති සහ එහි ප්‍රායෝගික භාවිතය'' සහ ''සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය'' යන මාතෘකා ඔස්සේ Zoom වැඩමුළු පවත්වන ලදී.

තවද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් පාසැල් මාධ්‍ය හා සන්නිවේදන විෂය උගන්වන ආචාර්යවරුන්, මාධ්‍ය සමාජ භාර ආචාර්යවරුන්ගේ සහ මාධ්‍ය සන්නිවේදන විෂය හදාරනු ලබන සිසුන්ගේ සන්නිවේදන හා සාක්ෂරතා දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් දේශන පවත්වා ඇත. එම දේශන මාලා සහිත Youtube නාලිකාවක් සහ Facebook පිටුවක් ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ.

සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුම, අවබෝධය සහ සන්නිවේදන උපක්‍රම සමාජගත කිරීම සහ ඩිජිටල් තාක්ෂණයට අනුගතවීම සඳහා අමාත්‍යාංශයේ අංශයක් ලෙස ස්ථාපිත ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය තම සහයෝගය ලබා දීමට සැලසුම් කර ඇත.

xiv) තාක්ෂණය මත පදනම්වන සමාජයක් බිහි කිරීම

2.1.2 ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

භෞමික රූපවාහිනී විකාශනය ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ සිට අංකිත (Digital) ක්‍රමවේදය දක්වා ගමන් කරන ගෝලීය ප්‍රවණතාවයට ශ්‍රී ලංකාව ද අනුගත විය යුතුය. වර්තමානයේ පවත්නා ප්‍රතිසම තාක්ෂණය ගෝලීයව යල්පිනූ තත්ත්වයට පත්ව ඇත. එබැවින් මාධ්‍ය ආයතන විකාශන පද්ධති නඩත්තු කිරීමේදී හා රජය අතිරේක රූපවාහිනී නාලිකා අවශ්‍යතාව සපුරාලීමේදී අභියෝගයන්ට මුහුණපෑමට සිදුව ඇත. ඉතාම කාර්යක්ෂම අංකිත (Digital) තාක්ෂණය ලොව පවතිද්දී ශ්‍රී ලංකාව තවදුරටත් ප්‍රතිසම (Analog) තාක්ෂණය භාවිතයෙන් සිදුවන්නේ සංඛ්‍යාත පරාසය (frequency spectrum) අපතේ යැවීමකි.

2009 වර්ෂයේදී DVB-T තාක්ෂණය යටතේ දැනට පවත්නා ප්‍රතිසම (Analog) භෞමික රූපවාහිනී විකාශනය අංකිත (Digital) භෞමික රූපවාහිනී විකාශනය දක්වා පරිවර්තනය කිරීම ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් DVB-T2 යුරෝපීය තාක්ෂණය ඔස්සේ ඉදිරියට ගෙනයාම සඳහා ක්‍රියාමාර්ග සහ සාධනීය පියවර කිහිපයක් ගෙන තිබුනද ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොලැබුණු බැවින් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2009 පළමු අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දින සිට අංකිතකරණ (Digitalization) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ මුලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය වන අතර, තාක්ෂණික ප්‍රමිතීන් ස්ථාපිත කරමින් අංකිතකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අංකිතකරණ විකාශන සැලැස්ම (Digital Broadcasting Road Map) සකස් කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

ඒ අතරතුර, ජපාන, JICA ආයතනය සමඟ කරන ලද ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස ජපාන ISDB-T තාක්ෂණය යොදා ගනිමින් සකස් කිරීමට යෝජනා විය. ඒ අනුව, ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2014 සැප්තැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා රජය විසින් ජපාන රජය සමඟ සහන ණය ගිවිසුමකට (Soft Loan Agreement) අවතීර්ණ විය. 2014 ඔක්තෝබර් මාසයේ දී එවකට ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශ විසින් එහි කටයුතු ආරම්භ කරන ලදී.

2021 දෙසැම්බර් මස අවසන් වීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවූ බැවින්, අතිගරු ජනාධිපතිතුමා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස හා ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා ඒකාබද්ධව යොමු කළ ‘‘ජපාන ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත

කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (SL-P112)" යන මැයෙන් වූ, 2021 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/21/0621/316/016 හා 2021.04.19 දිනැති අමාත්‍ය මණ්ඩලය එළැඹී තීරණය මගින් මෙම ව්‍යාපෘතිය යාවත්කාලීන කරන ලද තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

අංකිත (Digital)) තාක්ෂණයට අනුගත වීම මගින් රජයට අත්වන විශාලතම ප්‍රතිලාභය වන්නේ වර්තමානයේ භාවිතා වන සංඛ්‍යාත පරාසයෙන් (frequency spectrum) වැඩි ප්‍රමාණයක් මුදා හැරීමට ඇති හැකියාවයි. එබැවින් එම සංඛ්‍යාත පරාසය 5G නිරාහැන් පුළුල් පරාස (Broadband) සේවා සඳහා භාවිතා කිරීමට හැකිවන අතර මෙමඟින් නවීනතම තාක්ෂණය අත්විඳීමේ වාසිය රටට හිමිවේ.

සියලු විකාශන මෙහෙයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන තනි විකාශන ජාල වෙනුවට අංකිත (Digital) විකාශන ජාල මෙහෙයුම්කරු (Digital Broadcast Network Operator - DBNO) ලෙස තනි මෙහෙයවන්නෙකු ස්ථාපිතවීම රූපවාහිනී විකාශකයා ලබන වාසියකි.

ප්‍රතිසම (Analog) ක්‍රමවේදයේ අත්විඳිනු ලබන දුර්වල සංඥා ලැබීම වෙනුවට ඉතා උසස් අංකිත (Digital) රූප රාමු නැරඹීමට ඇති හැකියාව බහු රූපවාහිනී වෙනුවට සියලු රූපවාහිනී නාලිකා සඳහා එක් ඇන්ටනාවක් නිවසෙහි ස්ථාපිත කිරීම ප්‍රමාණවත් වීම, සියලු දේශීය නාලිකා එක සමාන තත්ත්වයෙන් රසවින්දනය කිරීමේ හැකියාව සහ අධි විස්තෘත (High Definition - HD) රූපවාහිනී නැරඹීමේ අත්දැකීම ලැබීම ප්‍රේක්ෂකයා වෙත ලැබෙන ප්‍රතිලාභ වේ.

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 17,717 කි. (JICA ආයතනයේ දායකත්වයේ වටිනාකම ජපන් යෙන් මිලියන 13,717 ක් ද රජයේ දායකත්වය ජපන් යෙන් මිලියන 3,505 ක් ද වශයෙනි.)

2021.07.15 දින මෙම ව්‍යාපෘතියේ මූලික පරිපාලන කටයුතු ආරම්භ කරන ලද අතර ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කරන ලදී. නිලධාරීන් බඳවා ගැනීම තාක්ෂණික උපදේශන සේවය හා ව්‍යාපෘති උපදේශන සේවය ලබාගැනීම යනාදී කටයුතු සිදුකරමින් පවතී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014.06.05 දින අනුමත කරන ලද කාර්යය මණ්ඩලයේ තනතුරු 27 න් තනතුරු 02 ක් හැර අනෙකුත් තනතුරු 25 සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට සැලසුම් කළද 2021.08.23 දින එම දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත්තේ 05 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් සඳහා පමණි. ඒ අනුව දැනට හතරදෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් මගින් ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතී. මෙම කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් නැවත ඉහත පරිදි 26 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් අනුමත කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිතය.

(i) මෙහි තාක්ෂණික උපදේශන සහය ජපානය වෙතින් ලබා ගත යුතු බැවින් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුව ව්‍යාපෘති උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් මගින් ලංසු කැඳවීමට අදාල කටයුතු මේ වන විට සිදු කර ඇත. ඒ අනුව යෝජනා කැඳවීම (Request for Proposals) 2021.12.27 වන දින අවසන් වේ. තාක්ෂණික ඇගයීම (Technical Evaluation) හා මූල්‍ය ඇගයීම (Financial Evaluation) 2022 පළමු කාර්තුව තුල සිදු කිරීමට අපේක්ෂිත අතර 2022 අප්‍රේල් මස වන විට ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය.

(ii) ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය සඳහා මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් මුදල් අමාත්‍යාංශය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව නියෝජනය වන පරිදි සාමාජිකයන්ගෙන් සහ JICA ආයතනයේ නියෝජිතයන්ගෙන් ද සමන්විත මෙහෙයුම් කමිටුවක් පත්කර ඇත.

(iii) DBNO පනත සකස් කිරීමට අදාළ කමිටුව පත් කිරීම පිළිබඳ හා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, යෝජනා හා නිර්දේශ ඇතුලත් වාර්තාවක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

(iv) විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීම සඳහා යෝජනා වී ඇති අතර අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු 2022 වසරේදී නිම කිරීමට සැලසුම් කර ඇත.

(v) 2021.12.17 සිට 2028.12.17 දක්වා ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා JICA ආයතනය වෙත දන්වා ඇත.

(vi) විදුලි සදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සංඛ්‍යාත වෙන් කර දීමට කටයුතු කර ඇත.

(vii) නිළ වශයෙන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට අදාළ උත්සවය 2021.12.28 වන දින ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි. එහිදී සියලුම මාධ්‍ය ආයතන වෙත මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් දැනුවත් කිරිමක්ද සිදු කරන ලදී.

(viii) මෙම ව්‍යාපෘතිය "විශේෂ ව්‍යාපෘතියක්" (Special Project) ලෙස ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2021.10.05 දින අනුමත කර ඇත.

(ix) 2021 වසර වෙනුවෙන් රු.මිලියන 8.0 ක ප්‍රතිපාදන ලබා දී ඇත. වියදම රු.මිලියන 6.948 කි.

ix) භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශ (සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ හත්වැනි කොටස)

2.1.3 පුනර්ජනනීය බලශක්තිය පෙරමුණට

අමාත්‍යාංශයේ විදුලි බිල ශූන්‍ය බිලක් බවට පත් කර ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්තිය උත්පාදනයට යොමු වී ඇත. ඒ අනුව සූර්ය විදුලි බලශක්තිය හඳුන්වා දීමට පියවර ගෙන ඇත. මෙම සම්බන්ධතාධවය ජාතික විදුලි පද්ධතියට (National Grid) සම්බන්ධ කිරීම ඉදිරියේදී සිදු වේ.

මීට අමතරව අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ඇති ආයතන ද පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි යොමු කිරීමද අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් කුච්චවේලිහි පිහිටි

ඉඩමේ සූර්ය විදුලි උත්පාදනය සඳහා රාජ්‍ය හවුල්කාරිත්ව ගිවිසුමකට එළඹීම සඳහා යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය හිමිව ඇත.

***(x) දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්* - (සෞභාග්‍යය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ දෙවන කොටස)**

2.1.4 රාජ්‍ය ව්‍යවසාය කළමණාකරණ ප්‍රතිපත්තිය

තරඟකාරී ව්‍යාපාරික ක්ෂේත්‍රවල වාණිජ කටයුතුවල යෙදී සිටින රාජ්‍ය ව්‍යවසායන් ඒ ඒ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන පෞද්ගලික ව්‍යවසායයන් සමඟ තරඟ කිරීමේ දී රාජ්‍ය ව්‍යවසායකයන්ට විශේෂ රාජ්‍ය අනුග්‍රහයක් ලබාදීම මගින් වෙළෙඳපොළ සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට බාධා නොකිරීමට කටයුතු සම්පාදනය කෙරේ.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන ලාභදායී ආයතන බවට පත් කිරීමට මග පෙන්වීම සිදු කෙරෙමින් පවතින අතර ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපාරික සැලැසුම් සකස් කිරීමට උපදෙස් දී ඇත. ආදායම් ඉලක්ක ලභා කර ගැනීමට අඛණ්ඩව පසුවිපරම් කටයුතු ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී සිදුකෙරේ. ආදායම් ඉහළ නංවා ගැනීම සහ වියදම් කළමනාකරණය කිරීමත් නිරන්තර මූල්‍ය විශ්ලේෂණයන් සිදු කිරීමත් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

2022 වසර තුල සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ලාභදායී ආයතන බවට පත්වීමත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සමායන ලක්ෂයට (Break-even Point) ලභා වීමත් අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ.

2.1.5 මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදී ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

රජයේ ප්‍රාග්ධන වියදම් සීමා කිරීම් හේතුවෙන් ආයතන, සැලසුම් කළ පරිදි ඉලක්කගත ප්‍රගතිය ළභා කරගැනීමට නොහැකි වී ඇත.

2.1.5.1 ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

වසන්තම් ටීවී නාලිකාව මෙරට දමිළ භාෂාව කතා කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත සුපැහැදිලි දසුන් නැරඹීමට හා දේශීය දමිළ වැඩසටහන් නිෂ්පාදනය කර විකාශනය කිරීමට හැකිවන පරිදි වැඩිදියුණු කිරීමේ ද්වීවාර්ෂික ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු මුදල රු.මි. 304 කි. 2021 වසර සඳහා මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මි. 250 ක් අනුමත වූ අතර වියදම රු.මි. 40.11 කි. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම හා ආනයන සීමා හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක ළභා කර ගැනීමට අසීරු විය.

2.1.5.2 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 100 ක් වෙන් වූවද අක් මුදල් ප්‍රමාදවී ලැබීම හේතුවෙන් යටියන්තොට විකාශනාගාරය සඳහා විදුලි ජනක යන්ත්‍රය, කරගහතැන්න විකාශනාගාරය සඳහා නව ඇන්ටනා කේබලය සහ ප්‍රධාන කාර්යාලය සඳහා 800A පුවරුව පමණක් මිලදීගැනීම සඳහා රුපියල් මිලියන 42 ක් වැය කරන ලදී.

2.1.5.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2021 වර්ෂය තුළදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද මුළු මහජන පැමිණිලි සංඛ්‍යාව 1000 ක් වූ අතර කොමිෂන් සභාව විසින් විභාග කිරීම සඳහා තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව එනම් නිසි අභියාචනා සංඛ්‍යාව 729 කි. ඉන් පැමිණිලි 500 ක් සම්බන්ධයෙන් විභාග කර නියෝග නිකුත් කර ඇත.

ස්විස්ටර්ලන්ත රජයේ ආධාර ඇතිව ජනවාර්ගික ගැටුම් ඇතිවූ ප්‍රදේශ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහජන හමුවීම් 03 ක්ද,

දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු පනත පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 03 ක්ද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 02 ක් සඳහා රජයේ ප්‍රතිපාදන වැය කරන ලදී. UNDP ආධාර යටතේ අභියාචනා ක්‍රියාවලියට තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේ (Web-based Tracking System) ව්‍යාපෘතියද, USAID ආධාර යටතේ තොරතුරු පනත යටතේ පොදු අධිකාරීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණ ව්‍යාපෘතියද අවසන් කර ඇත.

2021 වර්ෂය සඳහා කොමිෂන් සභාවට ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 2.97 ක් වෙන් වූ අතර වියදම රුපියල් මිලියන 2.66 කි.

2.1.5.4 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් පුවත්පත් 186 ක් ලියාපදිංචි කර ඇති අතර සහ පුවත්පත් පැමිණිලි විභාග කිරීමද සිදු කර ඇත. උසස් පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ඉගැන්වීමේ නියැලෙන ගුරුවරුන් හා සිසුන් සඳහා Zoom වැඩමුළු 09 ක් පවත්වන ලදී. මීට අමතරව ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු 6 ක්ද පවත්වා ඇත.

පුවත්පත් කලාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව (IX කණ්ඩායම) ආරම්භ කිරීමද සිදුකරන ලදී. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ නිල You Tube නාලිකාව හඳුන්වා දෙන ලදී. 2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 3.82 ක් වෙන් වූ අතර පරිගණක හා උපාංග, කාර්යාලීය ලීබඩු සහ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා වියදම රුපියල් මිලියන 2.731 කි.

2.1.5.5 ශ්‍රී ලංකා පදනම් ආයතනය

2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 100 ක් වෙන් වූ අතර අක් මුදල් වශයෙන් ලැබී ඇති රුපියල් මිලියන 42.17 ආයතන ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවන්, භූමිය ප්‍රතිසංස්කරණය සහ භාණ්ඩ හා උපකරණ මිලදීගැනීම් සඳහා වැය කරන ලදී.

2.2 අභියෝග

2.2.1 අලාභ මත පවත්වාගෙන යනු ලබන මාධ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පත් කිරීම

පෞද්ගලික විකාශන නාලිකා, මුද්‍රිත මාධ්‍ය මෙන් නොව සංස්කෘතිය ආරක්ෂා කිරීම මෙන්ම සභ්‍යත්වය ද ආරක්ෂා කරමින් කටයුතු කිරීම රාජ්‍ය මාධ්‍ය ආයතන සතු වගකීමයි. එතෙකුදු වුවද, වර්තමානයේ පවතින තරඟකාරීත්වය සමඟ නාලිකාවක ගුණාත්මකභාවය වෙනුවට අවධිමත් විකාශන වර්ගීකරණයට යටත්ව විකාශන නාලිකා සඳහා දැන්වීම් සැපයීම හේතුවෙන් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පවා රාජ්‍ය මාධ්‍ය ආයතන උපයන ආදායම ඔවුන්ට ප්‍රමාණවත් නොවේ. ජාතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිෂ්පාදනය හා විකාශය කිරීම සහ තරඟකාරිත්වය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශය, පරස්පර විරෝධී සාධක දෙකකි. මෙම ආයතන පාඩු ලැබීමට ප්‍රධාන සාධකය දරාගත නොහැකි මෙහෙයුම් කාර්ය වියදමයි. මෙම ආයතන අවම වශයෙන් සමායන ලක්ෂ්‍යයේ හෝ පවත්වා ගැනීමට ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කෙරේ.

2.2.2 ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකිත (Digital) තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසම (Analog) තාක්ෂණය වෙනුවට ලෝකයේ බොහෝ රටවල් විසින් නව තාක්ෂණික තත්ත්වයන් යටතේ වැඩිදියුණු කරන ලද ඩිජිටල් තාක්ෂණය රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. විශේෂයෙන්ම ප්‍රතිසම තාක්ෂණය ඉවත් වෙමින් පැවතීම නිසා එකී තාක්ෂණය මත පවත්නා විකාශන උපකරණ ඉදිරියේදී නඩත්තු කිරීම ගැටළු සහගතවේ. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයා ගැනීම සහ 2028 ඉලක්කගත වර්ෂය වන විට අවසන් කිරීම හා පෞද්ගලික මාධ්‍ය ආයතන සම්බන්ධ කර ගැනීම අභියෝගාත්මකය.

2.2.3 ජනමාධ්‍යවේදීන්ගේ ස්වාධීනභාවය ඉහළ නැංවීම

වර්තමානයේදී, ආර්ථික, සමාජීය සහ දේශපාලනික භූමිකාවන්හි ඉතාම ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් බවට ජනමාධ්‍ය පත්ව තිබේ. ජනතාව වෙත තොරතුරු සමීප කරලීම පිණිස ජනමාධ්‍ය ධනාත්මක දායකත්වයක් සපයන අතර එමඟින් යහපාලනය පවත්වාගෙන යාමට සහාය වේ.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සහතික කිරීමේදී නිදහස්, ස්වාධීන සහ ජනතා හිතකාමී මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වැදගත් වේ. මෙකී කර්තව්‍යය උදෙසා, යහපාලනයත් ප්‍රජාතාන්ත්‍රවාදයත්

පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමෙහිලා ජනමාධ්‍යවේදීන්ගේ පාර්ශවයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කෙරෙන අතර එබැවින්, රට තුල බහුත්ව සහ විවෘත මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තීය වශයෙන් බලගැන්වුනු ජනමාධ්‍යවේදී ප්‍රජාවක් පැවතිය යුතුය. පසුගිය දශක දෙක පුරාම, වෘත්තීය මාධ්‍යවේදීන් ජනිත කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය සාර්ථක වී නොමැත. ජනමාධ්‍ය සමාජයට වගකිවයුතු වන නිසාම, ඉහළම මාධ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරමින් අදාළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වෘත්තීය මාධ්‍යවේදීන් බිහිකිරීම මගින් අත්‍යන්ත මාධ්‍ය භාවිතයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීමේ සමාජ වගකීම ඉටුකරන ජාතික ආයතනයක් පිහිටුවිය යුතුවේ.

නවීන තාක්ෂණයේ දියුණුව හා ගෝලීය ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිරන්තර වෙනස්කම් සිදු වෙමින් පවතින අතර, එවැනි වෙනස්කම් සිදු කිරීමේදී වෘත්තීය සංවර්ධනය, ධාරිතාව ඉහළ නැංවීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව, යෝජිත මාධ්‍ය ආයතනය පිහිටුවීම අතිශයින් වැදගත් වේ.

2.2.4 අපක්ෂපාති විකාශන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

ගුවන් විදුලි හා දැන්වීම් ප්‍රචාරයේදී විකාශන ශ්‍රේණිගත කිරීම තීරණාත්මක සාධකයක් ලෙස බලපායි. විකාශන මධ්‍යස්ථානයන්හි වැඩසටහන් පෙළගැස්මේ සිට අන්තර්ගතයන් දක්වා බලපෑමකට ලක් කර ආර්ථික ශක්‍යතාවය අසමානුපාතික ලෙස පාලනය කිරීමේ හැකියාවක් ශ්‍රේණිගත කිරීම් දත්තවලට ඇත. රාජ්‍ය ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා පමණක් ක්‍රියාත්මකව තිබූ අවධියේ ශ්‍රේණිගත කිරීම් සිදු නොවූ අතර 1992 දී විකාශන ක්ෂේත්‍රයේ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව පෞද්ගලික සමාගම්වලට ඉඩ ප්‍රස්ථාව ලබාදී වසර කිහිපයකට පසුව ශ්‍රේණිගත කිරීම ආරම්භ විය. දැන්වීම්කරුවන් විසින් ශ්‍රේණිගතකිරීම් පුළුල් ලෙස භාවිතා කළද ගුණාත්මකභාවය අගයන රාජ්‍ය මාධ්‍ය ආයතන මෙම ක්‍රමවේදය පිළිබඳව තෘප්තිමත් නැත. එබැවින් අපක්ෂපාති ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ.

2.2.5 විකාශන නියාමන පනත හඳුන්වාදීම

තාක්ෂණික සහ නෛතික ස්ථරයන්හි සිදුවෙමින් පවත්නා වූ වෙනස්කම්, බලපත්‍ර නිකුත් කිරීමේ දී වර්තමානයේ පවතින යාන්ත්‍රණයෙහි පවත්නා අවිධිමත්භාවය, නිකුත් කරන ලද බලපත්‍රයන්හි පවත්නා ගැටළුකාරීභාවය මෙන්ම අතීතයේදී යම් අවස්ථාවන්හිදී මාධ්‍ය වල හැසිරීම පාදක කොට ගනිමින් රාජ්‍ය හා පුද්ගලික යන මාධ්‍ය ආයතන දෙපාර්ශවයම හැසිරවීම උදෙසා යම් ස්වාධීන ආයතනයක් පැවතිය යුතු බවට නිරීක්ෂණය විය.

2.2.6 රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි තාක්ෂණික තනතුරු සඳහා නවකයින් ආකර්ෂණය නොවීම.

2.2.7 රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණය සවිබල ගැන්වීම.

2.2.8 ගුවන් විදුලි ඩිජිටල්කරණය

2.3 අනාගත ඉලක්ක

i) මාධ්‍ය නිදහස තහවුරු වන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.

ii) රටේ සියලු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

iii) මාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

v) මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.

.....

ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය

වී.පී.කේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, ''ඇසිදිසි මැදුර'', කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ-05.

03 පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය **ඒසීඒ - එෆ්**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන්	තත්‍ය 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		438,470,000	158,527,000	
-	ආදායම් බදු	**1**	438,470,000	158,527,000	**ඒසීඒ-1**
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-		
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-		
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-		
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		438,470,000	158,527,000	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		284,805,000	112,298,000	**ඒසීඒ-3**
-	තැන්පතු		9,097,783	539,082	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		9,690,713	8,529,222	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**303,593,495**	**121,366,304**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**742,063,495**	**279,893,304**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		245,577,254	13,017,818	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		496,486,241	266,875,486	
-	අඩු කළා : වියදම් පුනරාවර්තන වියදම්				
-	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	106,988,179	133,896,967	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	64,046,145	68,353,317	**ඒසීඒ-2(ii)**
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	974,030,871	1,166,553,637	
-	පොළී ගෙවීම්	**8**	-		
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-		
-	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,145,065,195**	**1,368,803,921**	

අයවැය 2021 රු.		සටහන	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	103,649,866	7,539,965	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	55,807,519	8,026,931	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	65,781,566	312,548,784	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-		
-	හැකියා වර්ධනය	**14**	6,613,239	2,670,606	
-	වෙනත් මූලධන වියදම්	**15**	162,604,308	48,245,192	
-	**මුළු මූලධන වියදම් (උ)**		**394,456,498**	**379,031,479**	
	තැන්පතු ගෙවීම්		1,068,714	742,459	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		8,469,376	25,087,125	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**9,538,089**	**25,829,584**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,549,059,783	1,773,664,983	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(1,052,573,541)	(1,506,789,498)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,052,573,541)	(1,506,789,498)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				**ඒසිඒ-3**
				-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2021**	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	403,168,644	8,677,962
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	15,336,566	16,557,903
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	4,771,962
මුළු වත්කම්		**418,505,210**	**30,007,827**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		7,295,351	16,545,757
දේපළ පිරියත හා උපකරණ සංචිතය		403,168,644	8,677,962
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	8,041,215	12,146
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	4,771,962
මුළු වගකීම්		**418,505,210**	**30,007,827**

පිටු අංක 7 සිට 61 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 62 සිට 70 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
වී. පී. කේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය

වී.පී.කේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යංශය
163, ''ඇසිඳිසි මැදුර'', කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ-05.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජී. ඩී. පුෂ්පා කුමාරි

ජී. ඩී. පුෂ්පා කුමාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
2022.02.28
ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක: 163, කිරුළපන මාවත
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

දිනය : 2022.02.28

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	නැවත ගලපන ලද **2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	438,470,000	22,230,000
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	48,622,901	1,850,504
අග්‍රිම ලැබීම්	284,805,000	112,298,000
අත්තිකාරම් අයකර ගැනීම්	8,982,498	3,930,086
තැන්පතු ලැබීම්	9,097,783	539,082
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**789,978,181**	**140,847,672**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	338,726,827	90,570,614
සහනාධාර සහ මාරුකිරීම්	37,365,871	14,289,790
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,123,107	10,017,348
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	245,577,254	13,271,962
අත්තිකාරම් ගෙවීම්	8,032,886	1,996,662
තැන්පතු ගෙවීම්	1,068,714	742,459
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**631,894,658**	**130,888,836**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**158,083,523**	**9,958,836**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	158,083,523	10,212,980
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**158,083,523**	**10,212,980**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(158,083,523)**	**(10,212,980)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**(254,144)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**(254,144)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**254,144**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**0**

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) **<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **<u>මිනුම්කරණ පදනම</u>**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **<u>ආදායම් හඳුනාගැනීම</u>**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) **<u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1002-13-00	ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද	695,000	695,000	438,470	63%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමේ කාර්ය සාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	308,016	1,177,611	1,145,065	97%
ප්‍රාග්ධන	867,700	883,615	394,456	44%
එකතුව	**1,175,716**	**2,061,226**	**1,539,521**	**75%**

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා දීමනා	80	80	80	100%

02.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාමික නිළධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් පියවා ගැනීම.	1043	1043	1043	100%

3.8 මූලාෳ නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**2021.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2021.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	57,533	-	
9152	යන්ත්‍රෝපකරණ	-	88,636	-	
9153	ඉඩම්	-	257,000	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපති වාර්තාව

කාර්ය සාධන වාර්තාවේ ඉංග්‍රීසි පිටපත අවසානයේ අමුණා ඇත.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිතවූ දර්ශක	තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
		100% - 90%	**75% - 89%**	**50% - 74%**	**0% - 49%**
1	විකාශන නීතිය කෙටුම්පත් කිරීම	100%	-	-	-
2	තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ජනතාව දැනුම්වත් කිරීම	-	-	-	10%
3	වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම				
3.1	ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන	100%	-	-	-
3.2	මාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම (ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍ය ආයතනය)	-	-	-	20%
4	මාධ්‍යවේදීන් සඳහා පහසුකම් සැලසීම				
4.1	මාධ්‍යවේදීන් සඳහා නාගරික නිවාස සංකීර්ණයක් ඉදි කිරීම	-	-	-	5%
4.2	මාධ්‍යවේදීන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම	100%	-	-	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරීත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ට වීම

අරමුණු/ පරමාර්ථය	ඉලක්කය (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 00%
4. ගුණාත්මක අධ්‍යාපනය	4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම	ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය පිහිටුවීම Chartered Institute of Journalists – Sri Lanka	20%		
		ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන			100%
16. සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන	16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරු වලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම.	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම			
		අ) තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් සඳහා			100%
		ආ) මහජනතාව සඳහා			80%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ :

i. ෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහි කිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව මෙම අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ව්‍යාපෘති සංකල්පයට එකඟතාවය පල කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020.08.09 දින අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තෘතීක අධ්‍යාපන ආයතනයක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙම අමාත්‍යාංශයීය විෂය පථය යටතට පත් කිරීමත් සමඟම එම ආයතනය සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය ආයතනය පිහිටුවීමට කටයුතු කරමින් පවතී.

ii. තොරතුරුවලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරීමට 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ඉදිරිපත් කරන ද අතර එය ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබයි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව හරහා මහජන අභියාචනා විභාග කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

අභියෝග :

i. රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ඨ වීම.

ii. තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ මාධ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතන නවීන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iii. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

iv. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාධ්‍ය සහය ලබාදීමට රාජ්‍ය මාධ්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.

v. අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම මෙතෙක් ඉටු කරගත නොහැකිවීමෙන් ඵලදායී ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම.

vi. පොදු අධිකාරීන් හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධකර ජාලගතකිරීම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකිරීම.

vii. තොරතුරු දැනගැනීමේ පණත ක්‍රියාත්මක කිරීමේදී මහජන සම්බන්ධතාවය නිරතුරුව සිදුකිරීමට අවශ්‍ය පහසුකම් සහිත ඒකකයක් පිහිටුවීම.

viii. අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.

ix. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ විශිෂ්ඨ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

x. නව මාධ්‍ය අනිසි ලෙස යොදා ගැනීම වලකා මාධ්‍ය සාක්ෂරතාවය මඟින් මාධ්‍ය හරහා සිදුවන හිංසනයන් හා අපචාර අවම කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	25	19	06	00
තෘතීයික	06	02	04	00
ද්විතියික	89	57	32	00
ප්‍රාථමික	38	26	12	00
එකතුව	**158**	**104**	**54**	**00**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

කාර්ය මණ්ඩලයේ සේවකයින් 54 ක හිඟයක් පවතී. ශ්‍රම බලකායට හිඟයක් ඇති විට, සෑම සේවකයෙකුටම පැවරෙන අතිරේක රාජකාරි කටයුතු ප්‍රමාණය නිසි වේලාවට අවසන් කිරීම සඳහා මානසික ආතතියකින් සහ තෘප්තිමත්භාවයකින් තොරව කටයුතු කිරීමට සිදුවේ. එය කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය පහළ හෙලන අතරම සමස්තයක් ලෙස ආයතනයේ කාර්ය සාධනය අවම කරයි. ආයතනයේ නියමිත රාජකාරි ඉටුකිරීමේදී ප්‍රශස්ත මට්ටමින් රාජකාරි සම්පූර්ණ කිරීමට බාධාවන් ඇති වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

පාඨමාලා/ පුහුණු වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාලය	මුළු ආයෝජනය (රු.)		වැඩසටහනෙහි ස්වභාවය (විදෙස් / දේශීය)	සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම
			දේශීය	විදෙස්		
පරිගණක සහතික පත්‍ර පාඨමාලාව - නිපුනතා සංවර්ධන අරමුදල	03	පැය 96	75,000	-	දේශීය	පරිගණක දැනුම
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාව	02	පැය 70	90,000	-	දේශීය	රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුම
රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව	03	පැය 7	15,000	-	දේශීය	වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම
Certificate in Professional English	01	පැය 7	20,000	-	දේශීය	ඉංග්‍රීසි භාෂාව භාවිතය පිළිබඳ දැනුම
ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩමුලුව	03	පැය 14	14,000	-	දේශීය	ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ දැනුම
Diploma in English	01	මාස 24	80,000		දේශීය	ඉංග්‍රීසි භාෂාව භාවිතය පිළිබඳ දැනුම
Workshop on Public Procurement Procedure	01	පැය 14	7,000		දේශීය	රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුම
එකතුව	**14**		**301,000**			

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීමේ අරමුණ නම් කාර්යාලීය වැඩකටයුතු නිසි අයුරින්, ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ඔවුන් පොළඹවා ගැනීමයි. පුහුණු පාඨමාලා, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරන අතර ඔවුන්ගේ හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමටද ඉවහල් වේ.

රාජ්‍ය අංශයට නවක පත්වීම් ලද අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන් අනිවාර්ය පුහුණු පාඨමාලාවලටද යොමු කරන අතර මෙමගින් ඔවුන් රැකියාවට වඩා හොඳින් අනුගත වේ.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට හා නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව ලැබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් අමාත්‍යාංශයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නියමිත කාල සීමාව තුල පිළිතුරු සපයා නොමැත.	නියමිත කාල සීමාව තුල පිළිතුරු සැපයිය යුතු බවට උපදෙස් දීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	COVID ව්‍යසනය තත්ත්වය හමුවේ නිලධාරින් කැඳවීමට අපහසු වූ බැවිනි.	2022 වර්ෂයේ නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	සම්පාදනය කරමින් පවතී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	සම්පාදනය කරමින් පවතී.	

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	සකස් කරමින් පවතී.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	සකස් කරමින් පවතී.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	

විගණකාධිපති වාර්තාව

கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கை

Auditor General's Report

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සීඒඑම්/ඒ/එම්එම්/3/2021/589 මගේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 ජූනි 03 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ජනමාධ්‍ය අමාත්‍යාංශය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බවට (විස්තර පහත දැක්වේ.),

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 වර්ෂයේ වටිනාකම්වල සංසන්දනාත්මක අගයන් ලෙස 2020 වර්ෂයේ වටිනාකම් දැක්වීමේදී 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල අගයන් දැක්විය යුතු වුවද ලැබීම් හා ගෙවීම් අයිතමයන් 04 ක එකතුව රු.14,646,945 ක්වූ වෙනසක් පැවතුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ 2021 වර්ෂයේ වටිනාකම්වල සංසන්දනාත්මක අගයන් ලෙස 2020 වර්ෂයේ වටිනාකම් දැක්වීමේදී 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල අගයන් දැක්විය යුතු වුවද වියදම් අයිතමයන් 03 ක එකතුව රු.83,884,130 ක්වූ වෙනසක් පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 පුනරාවර්තන වියදම්

අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම යටතේ වූ දේශීය ගමන් වියදම් රු.1,776,462 ක් පුනරාවර්තන වියදම් යටතේ වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ තුළ ඇතුළත් කර තිබීම හේතුවෙන් වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ සඳහා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

1.6.1.2 අත්තිකාරම් ගෙවීම්

ලබාගත් රු.79,050 ක අත්තිකාරම් උපයෝජනය කිරීමෙන් තොරව සම්පූර්ණයෙන්ම පියවා තිබුණු අතර ලබාදුන් අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවත නව අත්තිකාරම් ලබාදුන් අවස්ථා 11 ක් පැවතුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඒසීඒ-6 ආකෘතිය අනුව දේපළ, පිරියත හා උපකරණ අගය රු.403,152,544 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එම වටිනාකම රු.403,168,644 ක් ලෙස දැක්වීම නිසා දේපළ, පිරියත හා උපකරණ අගය රු.16,100 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2.2 මූල්‍ය වත්කම්

අංක SA/MAA/02/01/01 හා 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2021/03 හි 7.9 අනුව මූල්‍ය කාලසීමාව අවසානයේ එක් එක් වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දැහි ශේෂයට ඇතුළත් නොකළ යුතු නමුත් 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා දැක්වීමේදී මූල්‍ය කාලසීමාව අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.4,771,962 ක් වූ මුදල් ශේෂය, මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා වැය කරන ලද රු.102,276,004 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් තුළ ඇතුළත් කර තිබූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය ඇස්තමේන්තුව අනුව ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද මඟින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ අදායම රු. 700,000,000 ක් වුවද අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද

ආදායම් ප්‍රකාශයේ (ඒසීඒ - 1) ආදායම් ඇස්තමේන්තුව ලෙස රු. 695,000,000 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු. 5,000,000 ක් විය.

(ආ) අමාත්‍යාංශයේ 2020 වර්ෂය අවසානයට හිඟ ආදායම රු. 53,157,130 ක් වුවද සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ප්‍රකාශයේ (ඒසීඒ - 1(i)) වර්ෂයේ ආරම්භක ශේෂය රු. 20,190,500 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.32,966,630 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම රු.32,966,630 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 85(1) ඇ සහ මු.රෙ.143(1) ප්‍රකාරව එකතු කිරීමට තිබෙන මුදල් හැකිතාක් දුරට නිවැරදිව තක්සේරු කළයුතු අතර, භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව ආදායම් ඉතා නිවැරදිව පුරෝකථනය කළයුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ඇස්තමේන්තුගත ආදායම රු.700,000,000 ක් වුවද වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු.438,470,000 ක් වූයෙන් අදායම් ඇස්තමේන්තුව හා රැස්කරන ලද ආදායම අතර විචලනය සියයට 37 ක් විය.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා වැය විෂයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිව තිබියදීත් 2021 පෙබරවාරි 22 දින එම වැය විෂයයන් සඳහා රු.7,245,000 ක් පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

(ආ) පරිපූරක ප්‍රතිපාදන ලබා දුන් ලිපිය අනුව පරිපූරක ප්‍රතිපාදන එය ප්‍රදානය කරන ලද විශේෂිත වූ අරමුණු සඳහා පමණක් යෙදවිය යුතු අතර මු.රෙ.66 යටතේ මාරුකිරීම් සිදු නොකළ යුතුය. එසේ වුවද වැය විෂයයන් 04 ක එකතුව රු.18,100,000 ක්වූ පරිපූරක ප්‍රතිපාදන මු.රෙ.66 යටතේ මාරු කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පුර්වාණුමාන කළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත් කර ඇති බවට සහ ඒවා මුදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටු කළ හැකි ශක්තිය ඇති බවටත් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වේ. එසේ වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා සකස් කරන ලද

ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචලතාවය සියයට -100 ත් සියයට 2,156 ත් පරාසක් දක්වා විහිදී තිබුණි.

(ඇ) වැය විෂයයන් 32 ක ප්‍රතිපාදන ඉතිරිය, සියයට 11 ත් සියයට 100 ත් වූ අතර මින් වැය විෂයයන් 11 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන් වලට මාරු කිරීමෙන් පසුද ඉතිරිවී තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

අමාත්‍යාංශය විසින් සමාලේචිත වර්ෂයට අදාළව රු.682,135 ක වියදම් 2022 වර්ෂයේදී පියවීමට කටයුතු කර තිබුණ ද, එම වියදම් බැඳීම් හා බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයනවල දක්වා නොතිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික විම් කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) 128(2)(ඇ)	හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා එම කාල සීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසය අවසන් වීමට ප්‍රථම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත හා එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 135	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීම සිදුකර නොතිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 9 මඟින් සංශෝධිත මු.රෙ. 371(2)(ආ) ඡේදය	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් එකම නිලධාරියා වෙත එකම දිනයකදී අවස්ථා 4 කදී රු.100,000 ඉක්මවා අත්තිකාරම් ලබාදී නිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 හි I කොටසේ 11.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ. 756(6)	භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තාව එළඹෙන මුදල් වර්ෂයේ මාර්තු 31 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයට අදාළ සමීක්ෂණ පවත්වා වාර්තා 2022 අප්‍රේල් 27 වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂය රු.87,588 ක් වූ අතර, එහි වර්ෂ 05 ට වැඩි රු.22,588 ක ණය ශේෂය අයකර ගැනීමට 2021 වර්ෂය අවසන් වන විටද අමාත්‍යාංශට විසින් කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ ක්‍රියාකාරකම් අතුරින් පාලන අංශය මගින් සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 6 ක්, මාධ්‍ය අංශයේ ඇසිදිසි පෙරමඟ යටතේ සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 7 ක් සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ අංශයේ මහජනයාගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 4 ක් සඳහා වූ ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ ප්‍රගති සමාලෝචන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

සංවර්ධන අංශය විසින් සැලසුම් කර තිබූ ප්‍රවෘත්ති විකාශන වෙබ් අඩවි ලියා පදිංචිය සහ අළුත් කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සකස් කිරීම සහ නීති අංශය මගින් සැලසුම් කර තිබූ රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය සහ ශ්‍රී ලංකා රූපවාහිනී පනත සංශෝධනය කිරීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදනයන් වෙනුවෙන් එවැනි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රසම්පාදනයන්හි කොන්ත්‍රාත් කාලය ඉක්මවන විට කාලය දීර්ඝ කර ගැනීමට ක්‍රියාකර නොතිබුණු අතර, අමාත්‍යාංශය විසින්ද ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය පරිශ්‍රය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම

ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළදී අමාත්‍යාංශ පරිශ්‍රය නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා උප කොටස් 12 ක් යටතේ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.179,483,827 ක් වූ ප්‍රසම්පාදනයන් සිදුකර 2021 දෙසැම්බර් 31 දිනට රු.113,404,335 ක් පමණ වැයකර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය විය.

මිල ගණන් විවෘත කිරීමෙන් පසු ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මීට අදාල ලංසු ඇගයීම් වාර්තාවක් 2021 ජූලි 20 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව අනුව නියමිත ආකෘතියෙන් ලංසු සුරක්ෂණ ලබා නොදීම නිසා අවම ලංසුව ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව නිර්දේශ කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් සෘජුවම අදාළ බැංකුව වෙත 2021 ජූලි 19 දින ලිපියක් ඉදිරිපත් කරමින් එම ප්‍රතික්ෂේපිත ලංසු සුරක්ෂණය නියමිත ආකෘතියට අනුව ලබාදෙන ලෙස දන්වා තිබුණි.

ii ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ආ) පරිදි ප්‍රමාණවත් නොවන ලංසු සුරක්ෂණ ප්‍රකාශන ආකෘති පත්‍ර විශාල බැහැරවීමක් වුවද නියමිත ආකෘතියට ලංසු සුරක්ෂණ ඉදිරිපත් නොකිරීම සුළු බැහැරවීමක් සේ සලකා තාක්ෂණික ඇගයීමක් සිදුකර නිර්දේශය ඉදිරිපත් කරන ලෙස 2021 ජූලි 19 දින අමාත්‍යාංශ ලේකම් විසින් උපදේශක ආයතනයට දන්වා තිබුණි. නමුත් උපදේශක ආයතනය විසින් අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනය නිර්දේශ කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව, උපදේශක ආයතනයේ නිර්දේශ නොසලකා අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය නිර්දේශ කර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රසම්පාදන කමිටුවේද අනුමැතිය ලබාදී ප්‍රතිග්‍රහණ ලිපිය 2021 ජූලි 22 ලබාදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව

මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව අදාල ආයතනය සමඟ 2022 මාර්තු දක්වාම විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

iii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට ඇතුළත් විය යුතු වුවද මෙයට සිවිල් ඉංජිනේරුමය කාර්යයන් ඇතුළත්ව තිබුණ ද, සිවිල් ඉංජිනේරුවරයකු තාක්ෂණික ඇගයීම් කමිටුවට ඇතුළත් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

හිටපු විෂයභාර අමාත්‍යවරයා සහ ඔහුගේ කාර්යමණ්ඩලය වෙත ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් වාහන 07 ක් වෙන්කර තිබුණු අතර, ඉන් අමාත්‍යවරයා වෙත වෙන්කර තිබූ වාහන 03 ක් සහ කාර්යමණ්ඩලය වෙත වෙන්කර තිබූ වාහන 01 ක් වශයෙන් වාහන 04 ක් විගණිත දින වූ 2022 අප්‍රේල් 20 දක්වා අමාත්‍යාංශය වෙත භාරදී නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් භෞමික රූපවාහිනී, ගුවන් විදුලි, චන්ද්‍රිකා (Satellite TV), Internet Protocol Television (IPTV), Cable TV සහ Mobile TV යන ආකාරයන් මඟින් විකාශනයන් සිදුකරනු ලබන ආයතන වෙත නිකුත් කරන ලද බලපත්‍ර සඳහා නියමිත කාලය තුළදී ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව බලපත්‍රලාභියාට දැනුම් දෙන බවට කොන්දේසියක් ඇතුළත් කර තිබුණ ද අමාත්‍යාංශය විසින් බලපත්‍ර ලබා දී තිබූ ආයතන 49 න්ම බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමට විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී පනත හා 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත ඇතිකිරීමෙන් පසු රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකා පවත්වාගෙන යාමට අවශ්‍ය විකාශන බලපත්‍ර නිකුත් කිරීම අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන අතර, 1979 දී ආරම්භකර සමාගමක් ලෙස කටයුතු කරන සී/ස ස්වාධීන රූපවාහනී මාධ්‍ය ජාලය මඟින් රූපවාහිනී නාලිකා 02 ක් සහ ගුවන් විදුලි නාලිකා 02 ක් පවත්වාගෙන යනු ලැබුවද එම ආයතනයට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය සොයා බලා කටයුතු කර නොතිබුණි.

(ඇ) රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේදී මෙතෙක් නිකුත් කළ බලපත්‍ර සඳහා කිසිදු බලපත්‍ර ගාස්තුවක් අයකර නොතිබුණු අතර වාර්ෂිකව හෝ කාලීනව බලපත්‍ර අලුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් හඳුන්වාදී නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද Cable TV/ Satellite /IPTV බලපත්‍රවල ඇතුළත් කොන්දේසි අනුව මෙරට තුළ විකාශය කරන විදෙස් නාලිකාවන් සඳහා එය සම්ප්‍රේෂණය කරනු ලබන රටෙහි නිසි බලයලත් ආයතනයක් මඟින් විකාශනයන් සඳහා නිසි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ලබාගෙන තිබිය යුතු අතර එම නාලිකාවන් මෙරට තුළ විකාශනය සඳහා අවසර ලබාගැනීමේදී එම බලපත්‍ර ඉදිරිපත් කළයුතුය. එසේ වුවද Cable TV/ Satellite /IPTV TV රූපවාහිනී විකාශනයන් සඳහා බලපත්‍ර ලබා සිටින ආයතන විසින් සිය නාලිකා කලඹ සඳහා නව විදේශ නාලිකා එක් කිරීමේදී අමාත්‍යාංශය විසින්, අදාළ නාලිකා එකී අවශ්‍යතා සපුරා ඇති බව තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය

මහජන අදහස් හා සහභාගිත්වය තුලින් රාජ්‍ය විෂයය තුල ක්‍රමෝපායිකව තොරතුරු ගලායාම සඳහා අංක අමප/16/1675/702/059 හා 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කර තිබුණු අතර අපේක්ෂා කල අරමුණු ඉටු නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 05 දිනැති අමප/19/3332/203/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එම මධ්‍යස්ථානය අහෝසිකර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක MMI 15/2/18/2020- LIII දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ පැවති යෝජනා අංක 02 අනුව පෙර පැවති ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරනු ලැබූ දැනට භාවිතයට නොගන්නා නිශ්වල හා වංචල දේපල මෙම නව ඒකකයට පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණ ද, දේපල පවරා ගැනීමට කටයුතු නොකර කාර්යාල උපකරණ ලබාගැනීම සඳහා රු.3,511,398 ක් වැය කර තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව පෙර පැවති ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කිරීමේදී එවකට එහි සේවය කළ සේවක පිරිසෙන් සැලකිය යුතු කොටසක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති බැවින් එම සේවක සංඛ්‍යාව මඟින් ආවරණය කළ නොහැකි තනතුරු සඳහා පමණක් නව බඳවා

ගැනීම් කළයුතු වුවද 2021 පෙබරවාරි 02 දින සිට කොන්ත්‍රාත් පදනමින් කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.

(ඇ) 2021 පෙබරවාරි 02 දින සිට වර්ෂයක කාලයක් සඳහා ප්‍රථමයෙන් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා පත්කර තිබුණු අතර ඉන්පසු 2021 මාර්තු 02 දින සිට කොන්ත්‍රාත් පදනමින් කාර්ය මණ්ඩලයක් පත්කර තිබුණි. කාලය අවසන් වීමෙන් පසු නැවතත් වර්ෂයක කාලයක් සඳහා පත්වීම් ලබාදී තිබුණ ද, කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරගැනීමට විගණිත දිනවූ 2022 මැයි 05 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය 2021 පෙබරවාරි 17 දින සිට 2022 අප්‍රේල් 08 දක්වා වරින් වර නිලධාරීන් 44 දෙනෙකු සේවය කර තිබුණු අතර, මෙම කාර්යමණ්ඩලයේ පැමිණීම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ ලිඛිත නිර්දේශයට අනුව එම කාලය තුල සේවය කළ නිලධාරීන් වෙත රු. 18,637,988 ක දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණද එම ගෙවීම් වවුවර්වලද නිලධාරීන් විසින් අත්සන් තබා නොතිබූ බැවින් එම මුදල් නිලධාරීන් වෙත ප්‍රේෂණය ඛූ බව සනාථ නොවීය.

P. H.

එම්.අයි.පුෂ්පා හේමමාලි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

www.media.gov.lk

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

අංක. 163, ඇසිඩිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
இல. 163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05
No. 163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

දුරකථන / தொலைபேசி / Telephone
011-2513 459, 011-2512 321, 011-2513 498

Department of Government Printing